# ‘පට්ඨාන’ ධර්ම දේශනා මාලාවේ
# 02. 08. 2018 දින පැවැත්වූ දේශනාව

නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අරිහත් වූ ශාන්ති නායක සම්මා සම්බුදුරජාණන්වහන්සේට මෝහ අන්ධකාරයෙන් අඳුරු වෙලා මුලා වෙලා පැවතුනා වූ ලෝකයක් ප්‍රඥා ආලෝකයෙන් ආලෝකමත් කරමින් ධර්ම ආලෝකයෙන් ආලෝකමත් කරමින් දිව්‍ය මනුස්ස බ්‍රහ්ම කියන කල්‍යාණ මිත්‍ර සන්තාන වලට ධර්ම ආලෝකය පතුරුවමින් ධර්මය විහිදුවමින් ප්‍රඥාව අවදි කරමින් ධර්මයට යොමු කරමින් ලෝකයේ පහළ වී වදාළා වූ අනන්ත ගුණ ඇති අනන්ත කරුණා ඇති ශාන්ති නායක සම්මා සම්බුදුපියාණන් වහන්සේට මම සිරසින් වැඳ නමස්කාර කරනවා. මාගේ නමස්කාරය වේවා! ඒ සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ බුදු ඇසින් දහම් ඇසින් දැක වදාළා වූ ලෝකයට දේශනා කොට වදාළා වූ අමෘත වූ ප්‍රණීත වූ සත්වයන්ගේ සන්තාන නිවා සනසා ලන්නා වූ ධර්මය මතුකර දෙන්නා වූ නිවන හමුකර දෙන්නා වූ ඒ උතුම් වූ ශ්‍රී සත්ධර්ම ස්කන්ධයට මම සිරසින් වැඳ නමස්කාර කරනවා. මාගේ නමස්කාරය වේවා! ඒ උතුම් ධර්ම මාර්ගයේ වැඩම කොට නිර්වාණ ධාතුව හමුකර ගත්තා වූ නිවනින් නිවී ගියා වූ ලෝකයාට අනුත්තර පුණ්‍යක්ෂේත්‍රයක් වූ අශ්ඨ ආර්‍ය පුද්ගල මහා සංඝරත්නයට මම සිරසින් වැඳ නමස්කාර කරනවා. මාගේ නමස්කාරය වේවා!

බුද්ධ රත්නයේ ධර්ම රත්නයේ සංඝ රත්නයේ අනන්ත අපරිමාණ ගුණ ආනුභාව බලයෙන් තුනුරුවන් කෙරෙහි ඒක චිත්තක්ෂණික වශයෙන් හෝ ගරු කිරීමෙන් නමස්කාර කිරීමෙන් වන්දනා කිරීමෙන් ගුණ හිතීමෙන් උපදවා ගත්තාවූ කුසල චේතනාවන්ගේ ධර්ම චේතනාවන්ගේ ආනුභාව බලයෙන් අපේ මේ ධර්ම සභාවට සාකච්ඡාවට සම්බන්ධ වී සිටින්නාවූ පින්වත් කල්‍යාණ මිත්‍ර සැමදෙනාගේම සිත් සතන් තුල මේ වෙනකොට පහළ වී ඇත්තා වූ මහානුභාව සම්පන්න කුසල චේතනාවන්ගේ පුණ්‍ය චේතනාවන්ගේ ආනුභාව බලයෙනුත් අදත් මේ පින්වත් සැමදෙනාටම මේ දහම් පාඩම හරහා කියලා දෙන්න

බලාපොරොත්තු වෙන්නා වූ  ධර්ම කාරණා ටික ඉතාමත්ම හොඳින් තේරුම් ගන්න ලැබේවා! අවබෝධ කරගන්න ලැබේවා! සැමදෙනාටම ඒ සඳහා කිසිම බාධකයක් උවදුරක් ඒවාගේම නීවරණයන්ගෙන් පීඩා විඳීමක් සිදු නොවේවා! චිත්ත ඒකාග්‍රතාවය  ඒවාගේම  මනසිකාරය ශක්තිය සිහිය නුවණ අවදි වේවා! මේ ධර්ම කරුණු යහපත්ව හොඳින් වටහාගෙන මෙනෙහි කරගෙන සැම දෙනාටම ධර්ම මාර්ගයේ  ගමන්කොට නිර්වාණ ධාතුව හමු කරගන්ට නිර්වාණ ධාතුවෙන් නිවීයන්ට ලැබේවා!  කියලා මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා.

එසේ ප්‍රාර්ථනා කරමින් අද මේ පින්වතුන්ට මේ ධර්ම කරුණු ටික අපි සිහිපත් කරනවා. කියලා දෙනවා. අපේ පින්වතුන්ට මතක ඇති අපි ගිය සතියේ කථා කළේ අකුසල් කොටස. අපි කථා කරන්නේ සහජාත ප්‍රත්‍යය පිළිබඳව මේ දවස්වල. නාම රූප ධර්මයන්ගේ වෙන වෙනම සහජාත වීමත් එකට එක්වෙලා සහජාත වීමත් කියවෙනවා. මම ගිය  සතියේ කිව්වා ආපස්සකට ගිහිල්ලා පොඩි මතක් කිරීමක්  කරගෙන අවදිකර ගැනීමක් කරගෙන අපි අපේ මේ පාඩමට එක්කාසු උනොත් හොඳයි කියලා අහපු ප්‍රශ්නයකුත් එක්ක.

මේ කොටස නැවත සිහිපත් කරගන්න කොට අපිට මහා පිහිටක් වෙනවා. බුදුරජාණන්වහන්සේගේ ධර්මය පුංචියට කඩලා බලනකොට පොඩියට පොඩියට ගොඩක් කොටස් වලට කැඩිලා යනවා. කැඩිලා යන ධර්ම කොටස් වෙන වෙනම තේරුම් ගන්න යනකොට අපේ හිතත් මනසිකාර වශයෙන් වෙහෙසවන්න  සිද්ධ වෙනවා, එහෙම නොවුනොත් අපිට ඒ ධර්මය අවබෝධ කරගන්න බෑ. අපිට උත්සාහයක් කරන්න ඕනෑ.

රූප ධර්ම පිළිබඳව දැන ගන්න ඕනෑ කියලා අපි කිව්වා. රූප ධර්මවල නිතර කියවෙන කොටස තමයි පඨවි ආපෝ තේජෝ වායෝ. සූත්‍ර දේශනාවලට ගිහිල්ලා බලනකොට පඨවි ආපෝ තේජෝ වායෝ කියන  ධර්මතා හතර බොහෝ සූත්‍ර දේශනා වල ආරම්මණික වශයෙන් දේශනා කරළා තිබෙනවා. ඒවගේම තමයි සූත්‍ර පිටකයේ ආයතන කොටසේ එහෙම  වර්ණ රූපය ගෝචර රූපය හැටියට දක්වලා තිබෙනවා. අභිධර්මය කොට්ඨාසයේ අපි රූප ටිකක් නැවත සිහිපත් කර ගනිමු. රූප වල තිබෙනවා නිෂ්පන්න රූප සහ

අනිෂ්පන්න රූප කියලා කොටසක්. නිෂ්පන්න රූප කියලා කියන්නේ විශේෂයෙන්ම කර්ම හේතුවෙන් හටගත්ත රූප කියන එකයි. අපි මේක මේ විදියට තේරුම් ගනිමු. රූප හැදෙන ක්‍රම 4 අපි මීට ඉස්සෙල්ලා පාඩමකදී දැනගත්තා.

රූප හැදෙනවා කර්මය කියන්නා වූ හේතුව මුල් කරගෙන. ඊළඟට රූප හැදෙනවා හිත මුල් කරගෙන, හිත කාරණයක් කරගෙන. තව රූප ජාතියක් හැදෙනවා බාහිරයේ තිබෙන්නා වූ ඍතු ගුණය හේතු වෙලා. තවත් රූප හැදෙනවා අනිත් රූපයකට උදව් කිරීමට ඉදිරිපත් වෙන ආහාරජ රූපයෙන්.

1) කර්මයෙන් රූප හැදෙනවා. 2) චිත්තයෙන් රූප හැදෙනවා 3) ඍතුවෙන් රූප හැදෙනවා 4) ආහාරයෙන් රූප හැදෙනවා. මේ තමයි රූප හැදෙන්නා වූ ප්‍රධාන කාරණා ටික.

මේ කර්මයෙන් හැදෙන්නා වූ රූප මේ විදියට භාවනා ක්‍රමයකට සිද්ධ කරනවා. ඇත්ත වශයෙන්ම රූප තනිව ගත්තොත් එහෙම මෙන්න මේ ටික කර්මයෙන් හැදෙනවා. ඒ තමයි **අවිනිබ්භෝග රූප** කියලා ජාතියක් තිබෙනවා. අවිනිබ්භෝග කියලා කියන්නේ වෙනස් කරන්න බැරි **රූප අට**. 'පඨවි' 'අපෝ' 'තේජෝ' 'වායෝ' 'වර්ණ' 'ගන්ධ' 'රස' 'ඕජා' කියන රූප ස්වභාව 8 වෙන් කරන්න බැරි වෙන්කළ නොහැකි අවිනිබ්භෝග රූප. මේ ටික ඔක්කොම එක පොදියට එක ගුලියට තමයි තිබෙන්නේ. ඊළඟට තිබෙනවා 'චක්ඛු ප්‍රසාද රූපය' 'සෝත ප්‍රසාද රූපය' 'ඝාණ ප්‍රසාද රූපය' 'ජිව්හා ප්‍රසාද රූපය' 'කාය ප්‍රසාද රූපය'. එතකොට අර 8 එකතුවෙනවා මෙන්න මේ කියන්නා වූ රූප 5. එතකොට ඔක්කොම රූප 13 ක් වෙනවා. ඊළඟට තව තිබෙනවා 'ස්ත්‍රී භාව රූපය' 'පුරුෂ භාව රූපය'. එතකොට 13 +2 = 15 යි. 'හෘදය වස්තු රූපය' කියලා එකක් තිබෙනවා. ඊළඟට 'ජීවිත ඉන්ද්‍රිය රූපය' තිබෙනවා. මෙන්න මේ කියන්නා වූ රූප ටික ඔක්කොම පහළ වෙන්නේ කර්මය මුල් කරගෙන. කර්මයෙන් හට ගන්නාවූ රූප කොට්ඨාශයක් තමයි මේ තිබෙන්නේ. මේවා තිබෙන්නේත් ඇත්ත වශයෙන්ම එක පොදියට. ගුලියට. කලාප වශයෙන්.

ඊළඟට තව තිබෙනවා සිතින් හටගන්නා රූප කොටසක්. මේ රූප ගත්තම ‘පඨවි’ ‘ආපෝ’ ‘තේජෝ’ ‘වායෝ’ ‘වර්ණ’ ‘ගන්ධ’ ‘රස’ ‘ඕජා’ කියන ඒ අවිනිබ්භෝග රූප 8 + කාය විඤ්ඤත්ති රූපය + වචී විඤ්ඤත්ති රූපය = 10 යි. තවත් තිබෙනවා අපේ සිත යහපත් වෙනකොට හැදෙන්නා වූ එකට උපදින රූප ස්වභාව තුනක්. ඒවාට කියනවා ‘ලහු’ ‘මුදු’ ‘කම්මඤ්ඤ’ කියලා. ලහුතා රූපය, මුදුතා රූපය සහ කම්මඤ්ඤතා රූපය. මෙතන තිබෙන්නේ රූපමය ගුණ ස්වභාව තුනක්. මේවා රූප හැටියට සලකනවා. එතකොට ඔක්කොම තිබෙනවා රූප 13. සමහර අවස්ථාවලදී එකතු වෙනවා ‘ආකාස රූපය’. මේ ආකාස රූපය සමහර අවස්ථාවලදී එකතුවෙන තැන් කියනවා. අනිත් එක තමයි ‘ශබ්ද රූපය’. දැන් අපි වචනයක් කථා කරනකොට ශබ්දයක් පිටවෙනවා. ඒක නිසා ඒ ශබ්ද රූපයත් ගන්නවා. සමහර වෙලාවට කියනවා චිත්තයෙන් හට ගන්නා රූප 14 ක් කියලා. සමහර වෙලාවට ආකාසය කිට්ටු කරොත් පහළොවක් වෙනවා. සමහර ස්වාමීන්වහන්සේලා ආකාසය අත හරිනවා. සමහර ස්වාමීන්වහන්සේලා ආකාසය එකතු කරනවා. මේ කියන්නා වූ රූප සමූහය 14 හෝ 15 සිතින් හටගන්නා වූ රූප හැටියට සලකනවා.

ඊළඟට තව තිබෙනවා ඍතුවෙන් හටගන්නා රූප කොටසක්. උෂ්ණය නිසා සීතල නිසා බාහිර ඍතු ගුණය නිසා හටගන්නා රූප වලට කියනවා ඍතුජ රූප කියලා. එතන තිබෙන්නෙත් ‘පඨවි’ ‘ආපෝ’ ‘තේජෝ’ ‘වායෝ’ ‘වර්ණ’ ‘ගන්ධ’ ‘රස’ ‘ඕජා’ කියන අවිනිබ්භෝග 8 . තවත් තිබෙනවා ගහක් එහෙම වැනෙන කොට ඇතිවෙන සද්දය, ඒ කියන්නේ ඒක ‘ශබ්ද රූපයක්’. එතකොට 9 යි. සමහර වෙලාවට ඇතිවෙනවා ඍතුව නිසා ‘ලහුතා’ ‘මුදුතා’ ‘කම්මඤ්ඤතා’ කියන්නා වූ රූප ස්වභාවයන් තුන. එතකොට ඇතිවෙනවා රූප 12 ක්. මෙන්න මේ කියන්නා වූ රූප සියල්ලම ඍතුවෙන් හටගන්නා වූ රූප හැටියට සලකනවා.

ඊළඟට තිබෙනවා ආහාරජ රූප. මේ ආහාරයේ තිබෙනවා එක්තරා ස්වභාවයක්. ඒ තමයි ඕජාමය රූපය. ඒක විශේෂයි. අනිත් එක තමයි ‘පඨවි’ ‘ආපෝ’ ‘තේජෝ’ ‘වායෝ’ ‘වර්ණ’ ‘ගන්ධ’ ‘රස’ ‘ඕජා’ (8) + ලහුතා රූපය + මුදුතා රූපය + කම්මඤ්ඤතා රූපය කියන්නා වූ රූප තුනයි. එතකොට

සියල්ල 11 යි. මේ කියන්නා වූ රූප 11 සලකනවා ආහාරයෙන් හටගන්නා රූප හැටියට.

දැන් මේ කියපු කොටසේ හැටියට විශේෂයෙන්ම රූප 18 ක් කර්මයෙන් හටගන්නා රූප හැටියට කියනවා. ඊළඟට රූප 14 ක් හෝ 15 ක් සිතින් හටගන්නා රූප හැටියට කියනවා. ඊළඟට රූප 12 ඍතුවෙන් හටගන්නා වූ රූප හැටියට කියනවා. ඊළඟට රූප 11 ක් ආහාරයෙන් හටගන්නා වූ රූප හැටියට කියනවා.

දැන් මේ රූප හටගැනීමේදී විශේෂයෙන්ම කර්මයෙන් හටගත්ත රූප පිළිබඳව හිතාගෙන යනකොට අපිට රූප ගුණය විදර්ශනා කිරීමට පාදක කර ගැනීමට පුළුවන් ආයතන වශයෙන්. 'චක්ඛු ප්‍රසාද රූපය' 'සෝත ප්‍රසාද රූපය' 'ඝාණ ප්‍රසාද රූපය' 'ජිව්හා ප්‍රසාද රූපය' 'කාය ප්‍රසාද රූපය'. ඊළඟට 'හෘදය වස්තු රූපය' වගේ රූප භාවනාවට ගන්නවා. අපිට දැනට තිබෙන්නේ රූපමය වශයෙන් පහළ වූ දේ. ඒවා ඇති වූ හේතුව තිබෙන්නේ පිටිපස්සේ.

ඒවාගේම පහුගිය පාඩමකදී අපිට ඇතිවෙච්ච දැනගත ගත යුතු කාරණයක් තමයි සිතින් හටගන්නා වූ රූප සම්බන්ධව. හිතින් හටගන්නා රූප හැටියට තිබෙන්නේ 'පඨවි' 'ආපෝ' 'තේජෝ' 'වායෝ' 'වර්ණ' 'ගන්ධ' 'රස' 'ඕජා' කියන රූපමය 8 + වචී විඤ්ඤත්තිය + කාය විඤ්ඤත්තිය + වචී විඤ්ඤත්තියට සම්බන්ධ පවතිනාවූ ශබ්දයයි + ලහුතා + මුදුතා + කම්මඤ්ඤතා යන රූප.

දැන් මේ ටික මෙහෙම දැනගෙන අපි හිතමු බලන්න සහජාත ප්‍රත්‍යයට ගිහිල්ලා. ඒ සහජාත ප්‍රත්‍යයේ තිබුණා කථාවක්. ඒ තමයි සහජාත කියලා කියනකොට සමහර වෙලාවට නාම ධර්ම වෙන වෙනම පහළ වෙන හැටි කියනවා. ඊළඟට රූප ධර්ම වෙන වෙනම පහළ වෙන හැටි කියනවා. සමහර වෙලාවට නාම ධර්මයි රූප ධර්මයි දෙකම එකට පහළ වෙන හැටි කියනවා. ඔන්න ඔය අවස්ථාවේදී චිත්තජ රූපයෝ සහජාත රූප භාවයට පත්වෙනවා. ඒක තමයි අපි දැනගත යුතු වෙන්නේ මෙතැනදී මේ කාරණය තේරුම් ගන්න.

දැන් අපි වීථියකට යමු. සහජාත ප්‍රත්‍යය විස්තර කිරීමේදී විසර්ජනා වීථිවාර කියලා තිබෙන්නේ නාම ධර්ම වලට වඩා සකන්ධ වචනය පාවිච්චි කරලා. දැන් අපි මේ වෙලාවේදී කියන්නේ අව්‍යාකෘත වීථිය.

## 7) වෙනි වීථිය

**අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස සහජාතපච්චයෙන පච්චයො**

දැන් අපේ පින්වතුන් මේ වාක්‍යය අහනකොට තේරුම් ගැනීම වටිනවා **අබ්‍යාකත ධර්මය** කියලා කියන්නේ මොකක්ද කියලා. මම නැවත නැවත කියන්නේ මේ අව්‍යාකෘත ධර්ම මේ පින්වතුන්ගේ සිතේ හොඳට අවබෝධාත්මකව තැන්පත් කරගැනීමටයි. අව්‍යාකෘත ධර්ම කියලා විපාක වලටත් කියනවා. ඒ කියන්නේ ඉස්සෙල්ලා කරපු කර්මයක දැන් ලැබෙන විපාකයක්. ඒ විපාක කාණ්ඩයට බෑ තව විපාකයක් ඉස්සරහට හදන්න. එහෙම හයියක් ඒකට නැති නිසාත් වෙනත් එහෙක විපාකයක් හැටියට දැන් පහළ වෙලා තිබෙන නිසාත් කියනවා **විපාක අව්‍යාකෘතය** කියලා. තව තිබෙනවා **ක්‍රියා අව්‍යාකෘතය**. රහතන්වහන්සේලාගේ පහළ වෙන සිත්. අහේතුක සිත්. ඒවා ක්‍රියා අව්‍යාකෘත. ඊළඟට තිබෙනවා රූප. 'රූප' කර්ම හදන ඒවා නොවෙයි. ඒවා කුසල් අකුසල් වෙන්නේ නෑ. ඒවා අනාගතයට කුසල් හදන්නෙත් නෑ, අකුසල් හදන්නෙත් නෑ. ඒක නිසා ඒවාට කියනවා අව්‍යාකෘතයි කියලා. ඊළඟට නිර්වාණ ධාතුව අව්‍යාකෘත ධාතුවක්. දැන් මේ වීථියේ තිබෙන්නේ මොකක්ද කියලා අපි තේරුම් ගනිමු.

**අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස සහජාතපච්චයෙන පච්චයො** = අව්‍යාකෘත කියන්නා වූ ධර්මයක් අව්‍යාකෘත තවත් සහජාත ධර්මයකට ප්‍රත්‍යය ශක්තියෙන් උපකාර වෙනවා.

දැන් මේක කොහොමද අපි තේරුම් ගන්නේ? රූප කවදාකවත්ම නාම ධර්මයන්ට උදව් දෙනවද? නෑ. රූප නිසා චෛතසික හටගන්නේ නෑ. රූප නිසා හිත් හටගන්නේ නෑ. හැබැයි හිත නිසා රූප හටගන්නවා. ඒක නිසා

මේකේ වැඩි ගැම්ම තිබෙන්නේ නාම ධර්ම පැත්තට. දැන් චිත්තජ රූප තිබෙනවා, අපිට පැහැදිලියි. කර්මජ රූප තිබෙනවා අපිට පැහැදිලියි. ඍතුජ රූප තිබෙනවා පැහැදිලියි. ආහාරජ රූප තිබෙනවා පැහැදිලියි. ඒකෙන් කියන්නේ කර්මයෙන් හැදෙන රූප තිබෙනවා, සිතින් හැදෙන රූප තිබෙනවා, ඍතුවෙන් සහ ආහාරයෙන් හැදෙන රූප තිබෙනවා කියන එකයි.

අනිත් අතට ගත්තයින් පස්සේ හිත නිසා රූප හැදෙනවා. හැබැයි රූප නිසා හිත හැදෙනවා කියන්නේ නෑ. රූප නිසා කර්මය හැදෙනවා කියන්නේ නෑ. රූප නිසා ඍතුව හැදෙනවා කියන්නේ නෑ. රූප නිසා ආහාර හැදෙනවා කියලා කියන්නේ නෑ. මේ කථාවේදී මෙතැන තිබෙන්නේ සිත නිසා රූප හැදෙනවා කියලා. ඒකයි 'චිත්තජ රූපය' කියලා කියන්නේ.

දැන් අපි බලමු මෙහෙම. ක්‍රියා සිතක් පහළ වෙනවා. ඒ ක්‍රියා සිත පහළ වෙනකොට ඒක අව්‍යාකෘතයක්. අපි හිතමු රහතන්වහන්සේ නමක් වැඩ ඉන්නවා. ඒ රහතන්වහන්සේ ගමනක් වඩින්න හිතනවා. උන්වහන්සේ ඒ ගමනක් යන්න ඕනෑ කියලා සිතන වෙලාවේ උන්වහන්සේට පහළ වෙන්නේ අවකෘත ක්‍රියා සිත්. ඒ කියන්නේ ක්‍රියා අව්‍යාකෘත. ඒවා ක්‍රියා මාත්‍රා පමණයි. ඒ උන්වහන්සේගේ සිතේ පහළ වෙන දේවල් කුසලුත් නොවෙයි. අකුසලුත් නොවෙයි. දැන් ඒ ක්‍රියා සිත් එක්ක වැඩ කරන චෛතසික ධර්ම සමූහයක් තිබෙනවා. දැන් රහතන්වහන්සේ වැඩම කරනවා. වැඩම කරනකොට උන්වහන්සේගේ ඒ සිත් ටික සහ චෛතසික ටික අව්‍යාකෘතයි = **අබ්‍යාකතො ධම්මො.** අනිත් එක තමයි **අබ්‍යාකතස්ස ධම්මස්ස**. අබ්‍යාකතස්ස ධම්මස්ස කියලා කියනකොට මෙතැන සහජාත නිසා ඒ නාම ධර්ම ටික, චෛතසික ධර්ම සියල්ලම ඒ ක්‍රියා සිතට උපකාර වෙනවා. ඒ ක්‍රියා සිත චෛතසික ධර්මයන්ට උදව් වෙනවා, උපකාර වෙනවා. අපි ඕක අව්‍යාකෘත ස්කන්ධ වලට දාල බැලුවහම මෙහෙමයි.

ඒ රහතන්වහන්සේගේ 'හිත' තමයි 'විඤ්ඤාණ ස්කන්ධය' හැටියට සලකන්නේ. ඒ විඤ්ඤාණයට ආධාර වෙලා ළඟ උපදින්නා වූ ඒකට සම්බන්ධ වෙලා පහළ වෙන්නා වූ 'වේදනා' චෛතසිකය තමයි 'වේදනා ස්කන්ධය'

හැටියට සලකන්නේ. රහතන්වහන්සේගේ සිතේ ඒ ක්‍රියා චිත්තයත් එක්ක පහළ වෙන 'සංඥාව' තමයි 'සංඥා ස්කන්ධය' හැටියට සලකන්නේ. ඊළඟට උන්වහන්සේගේ සිතේ පහළ වෙන අනිත් 'චෛතසික ධර්ම' ටික තමයි 'සංස්කාර ස්කන්ධය' හැටියට සලකන්නේ. එතකොට මේකේ තිබෙනවා ඒ වගේ ධර්ම ගොඩවල් හතරක්. ඒ ඔක්කොම අව්‍යාකෘතයි. එතකොට මේ වේදනාව, සංඥාවටයි සංස්කාර කොටසටයි විඤ්ඤාණ කොටසටයි උදව් වෙනවා. ඒ කියන්නේ සහජාත වශයෙන්, එකට ඉපදීම් වශයෙන්. විඤ්ඤාණය, අනිත් තුන්දෙනාට උදව් වෙනවා උපකාර වෙනවා, එකට ඉපදීම් වශයෙන්, සහජාත වශයෙන්. සංඥා සංඛාර දෙක අනිත් දෙන්නට උදව් වෙනවා, උපකාර වෙනවා සහජාත වශයෙන්. එතකොට මේ හැම එකක්ම අනිත් එක්කෙනාට උදව්වක් ගැම්මක් උපකාරයක් ලබා දීගෙනම තමයි, ප්‍රත්‍යය ගුණයක් ඒකට ඇඳගෙනම තමයි මේවා පහළ වෙන්නේ. ඔවුනොවුන්ට උපකාර කරගන්නා වූ ගුණ විශේෂයක් එහෙම නැත්නම් එකට පහළ වෙන ගුණ විශේෂයක් මේකේ තිබෙනවා. මේ හැම එකක්ම අව්‍යාකෘත නිසාත් කර්ම හදන්නේ නැති නිසාත් මේ කාණ්ඩය, රහතන්වහන්සේගේ සිතෙහි පහළ වෙන්නා වූ මේ සිත් අපිට හොඳට තේරුම් ගන්න පුළුවන්. මේ තමයි **'අව්‍යාකෘත ධර්මයට සහජාත භාවයෙන් ප්‍රත්‍යය වෙනවා'** කියලා කියන තැන.

අපිට ලේසියක් තිබෙනවා රහතන්වහන්සේ නමක් පිළිබඳව හිතලා මේ කාරණය තේරුම් ගන්න. එතැනදී තව විශේෂත්වයක් තිබෙනවා. ඒ තමයි රහතන්වහන්සේගේ ජීවිතියේ ඔය කියන්නා වූ 'වේදනා' 'සංඥා' 'සංඛාර' 'විඤ්ඤාණ' කියන අව්‍යාකෘත නාම ධර්ම ටික පහළ වෙනවා වගේම ඒ සිතට අනුකූලව පහළ වෙනවා තවත් අව්‍යාකෘත ධර්මයක්. ඒ තමයි 'චිත්තජ රූප'. රහතන්වහන්සේ නමක් කථා කරනවා. රහතන්වහන්සේ නමක් කථා කරනකොට වචී විඤ්ඤත්තිය හැදෙනවා. ශබ්දය හැදෙනවා. ඒ වචී විඤ්ඤත්තියටයි ශබ්දයටයි එන්න තව තිබෙනවා පඨවි ආපෝ තේජෝ වායෝ වර්ණ ගන්ධ රස ඕජා කියන්නා වූ ධර්මතා 8 ඒ එක්කම පහළ වෙනවා. එතකොට එතන තිබෙන ඔක්කොම ටික අව්‍යාකෘත ධර්මයි. ඒක නිසා **අබ්‍යාකතස්ස ධම්මස්ස සහජාතපච්චයෙන පච්චයො** කියලා සහජාත භාවයෙන් ප්‍රත්‍යය වෙනවා.

අනිත් එක තමයි අපි හිතමු මෙහෙම. දැන් රහතන්වහන්සේ නමක් ගමන් කරනවා. ගමන් කරන කොට උන්වහන්සේගේ කයේ පහළ වෙන්නා වූ රූපස්වභාවයක් තිබෙනවා. ආන්න ඒ රූප ස්වභාවයක් ටික ඔක්කොම චිත්තජ රූප ස්වභාව හැටියට සලකනවා. අනිත් එක තමයි අපි හිතමු රහතන්වහන්සේ නමක් කරුණාවෙන් යුක්තව කෙනෙකුට කථා කරනවා. ඒ කථා කරන වේලාවේ උන්වහන්සේගේ සිතේ තිබෙන්නා වූ මෘදු ගතිය, ඒ වාගේම උන්වහන්සේගේ සිතේ තිබෙන්නා වූ කරුණාව දයාව නිසා ශබ්දය සහ අනිත් රූප ටික ඔක්කොම මෘදු ඒවාගේම ගුණවත් ගතියක් ඇතිවෙනවා. අර අපි කියපු ලහු මුදු කම්මඤ්ඤතා කියන ධර්මයෝ එතැනදී හැදෙනවා චිත්තජ රූප වශයෙන්.

මේ විදියට ගත්තම අව්‍යාකෘත ධර්ම සමූහයක් නිසා එනම්, ඔක්කොම තිබෙනවා කාමාවචර ක්‍රියා සිත් තිබෙනවා 8 + රූපාවචර ක්‍රියා සිත් 5 + අරූපාවචර ක්‍රියා සිත් 4 = 17 + තව තිබෙනවා පංචද්වරාවජ්ජනය + මනෝද්වරාවජ්ජන + හසිත උත්පාද සිත = 20 යි. මේ ක්‍රියා සිත් 20 තුළ වැඩ කරන්නා වූ පොදු වශයෙන් තිබෙන්නා වූ චෛතසික ධර්ම තිබෙනවා 38 ක්. මේ තමයි නාම ධර්ම. ඒ තමයි යම් කිසි දේකට ප්‍රත්‍යයක් දෙන්න පුළුවන් හයිය ගැම්ම තිබෙන ටික.

ප්‍රත්‍යය උප්පන්න හැටියට ගත්තම තිබෙන්නේත් අව්‍යාකෘත ධර්මමයි. ඒවා තමයි මේ කියපු ක්‍රියා 20 + විපාක සිත් + චෛතසික ධර්ම + චිත්තජ රූප. මේ ඔක්කොම එක විට පහළ වෙන එක නොවෙයි මේ කියන්නේ. දැන් චෛතසික ධර්ම 38 කියලා කිව්වට එක වෙලාවටම චෛතසික ධර්ම 38 පහළ වෙන්නේ නෑ. ඊට අඩු ප්‍රමාණයකින් පහළ වෙන්නේ. කරුණාව දක්වන වෙලාවට එක චෛතසික set එකක්. මෛත්‍රීය දක්වන වේලාවට වෙන චෛතසික set එකක්. විදර්ශනා භාවනා කරනකොට වෙන චෛතසික set එකක්. ඔය විදියට වෙනස් වෙමින් අඩු වැඩි වශයෙන් චෛතසික පහළ වෙනවා. මෙතැනදී අපි තේරුම් ගන්න ඕන මේ චිත්ත වීථියට අනුකූලව **අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස සහජාතපච්චයෙන පච්චයො** කියන තැන අව්‍යාකෘත වූ නාම ධර්මයෝ අව්‍යාකෘත වූ නාම ධර්මයන්ටත් රූප

ධර්මයන්ටත් එකට ඉපදීමේ ප්‍රත්‍යය ශක්තියෙන් ගොනුවෙලා උපදිනවා කියන එකයි. ඔය කාරණය අපි ඔය විදියට තේරුම් ගන්නවා.

අපි වචන දෙකක් පාවිච්චි කරනවා. ඒ තමයි ප්‍රතිසන්ධි අවස්ථාව ප්‍රවෘත්ති අවස්ථාව කියලා. ප්‍රතිසන්ධි අවස්ථාවේදීත් අව්‍යාකෘත ධර්ම අව්‍යාකෘත ධර්මයන්ට සහජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා. ඊළඟට ප්‍රවෘත්ති අවස්ථාවේදීත් අව්‍යාකෘත ධර්මයක් අව්‍යාකෘත ධර්මයකට සහජාත වශයෙන් ප්‍රත්‍යය වෙනවා. මොකක්ද මේ ප්‍රවෘත්තිය කියලා කියන්නේ? ප්‍රවෘත්ති කියලා කියන්නේ ඉපදුනාට පස්සේ පවතින්නා වූ කාලය. දැන් අපි ඉන්නේ ප්‍රවෘත්ති අවස්ථාවේ. අපේ ජීවිතියේ පවතින අවස්ථාව. අපි යම් කිසි වේලාවක මව් කුසක පිළිසිඳ ගත්තානම් ඒ ප්‍රතිසන්ධි අවස්ථාවයි. දැන් අපි කථා කළ රහතන්වහන්සේගේ විස්තරය ප්‍රතිසන්ධි අවස්ථාව නොවෙයි. ඒ ප්‍රවෘත්ති අවස්ථාවක් උදාහරණයට ගත්තේ. දැන් අපි යමු මේකේ මුල් අවස්ථාවට. ඒ කියන්නේ ප්‍රතිසන්ධි අවස්ථාවක කොහොමද අව්‍යාකෘත ධර්මයක් අව්‍යාකෘත ධර්මයකට සහජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙන්නේ කියලා බලන්න.

එතන තිබෙන්නේ විපාක සිතක්. දැන් විපාක සිතක් පහළ වෙන්නේ පෙර කරපු කර්ම ශක්තියක් නිසා. පංචවෝකාර භවයක රූපයකුත් එක්කාසු කරගෙන රූපයකුත් ළං කරගෙන පහළ වෙනවා නාම ධර්ම ටික. ඒ අවස්ථාවේදී විපාක සිත අව්‍යාකෘත 'විපාක විඤ්ඤාණයක්'. ඒකෙ හටගන්නා වූ අනෙක් නාම ධර්ම ටික 'විපාක නාම ධර්මයි'. ඒ පළමුවෙනි අවස්ථාවේදී <u>චිත්තජ රූප හටගන්නේ</u> **<u>නෑ</u>.** එතැනදී හටගන්නේ කර්මයේ විපාකයක් හැටියට හදලා දෙන්නා වූ ප්‍රතිසන්ධි අවස්ථාවේදී හටගන්නා වස්තු රූපයයි. එතනත් තිබෙනවා අව්‍යාකෘත ධර්මයක් අව්‍යාකෘත ධර්මයකට සහජාත භාවයෙන් හේතු වෙනවා කියන එක. මේකේ කියන්නේ බලපෑම නොවෙයි. මෙතැනදී කියන්නේ එකට උපදිනවා කියන කථාවයි. එතකොට ප්‍රතිසන්ධි අවස්ථාවේදී චිත්තජ රූපයක් එකට සහජාතව හටගන්නේ නෑ. එතැනදී හටගන්නේ කර්මයේ විපාකයක් හැටියට ඉදිරිපත් වෙන්නා වූ දෙය.

මෙහිදී ප්‍රත්‍යය උප්පන්න වශයෙන් ඇතිවෙන්නෙත් ප්‍රතිසන්ධි සිත සහ චෛතසික ධර්ම. ඔය විදියට **අව්‍යාකෘත ධර්ම අව්‍යාකෘත ධර්මයන්ට සහජාත භාවයෙන් ප්‍රත්‍යය වෙනවා.**

තව තිබෙනවා මේ ගැන විස්තර කරන පාලි පාඨයක්. ඒකෙ හොඳට පැහැදිලි කරලා දෙනවා.

- **විපාකාබ්‍යාකතො කිරියාබ්‍යාකතො එකො ඛන්ධො තිණ්ණන්නං ඛන්ධානං චිත්තසමුට්ඨානානඤ්ච රූපානං සහජාතපච්චයෙන පච්චයො**

විපාක අව්‍යාකෘතය (විපාක සිත්) හෝ ක්‍රියා අව්‍යාකෘතය ( ක්‍රියා සිත්) දෙක කවදාකවත් එකට පහළ වෙන්නේ නෑ. ඒවා වෙන වෙනම තිබෙන්නේ. නමුත් විග්‍රහාත්මක කොටස තමයි මේ. විපාක අව්‍යාකෘතයක් හෝ ක්‍රියා අව්‍යාකෘතයක් ඇති වෙනකොට ඒ ‘සිත’ ‘එක සකන්ධයක්’ වෙනවා = (එකො ඛන්ධො) එතකොට අනිත් වේදනාව සංඥාව සහ සංඛාර කියන සකන්ධ තුනට (තිණ්ණන්නං ඛන්ධානං) සහ ඒ සිත් සමග සමගාමීව පහළ වෙන චිත්ත සමුට්ඨානික රූප සමග එකට උපදිනවා (චිත්තසමුට්ඨානානඤ්ච රූපානං). අනිත් එක්කෙනා උපදවාගෙන එන ගතියක් අනිත් එක්කෙනාගේ ආධාරය ලබාගෙන තමන් උපදින ගතියක් මේ ධර්මවල තිබෙනවා. මේ ප්‍රත්‍යය ධර්ම ටික ඔවුනොවුන්ට එක්කාසු වෙලා සහජාත භාවයෙන් උපදිනවා. (සහජාතපච්චයෙන පච්චයො)

- **තයො ඛන්ධා එකස්ස ඛන්ධස්ස චිත්තසමුට්ඨානානඤ්ච රූපානං සහජාතපච්චයෙන පච්චයො**

**තයො ඛන්ධා** = ස්කන්ධ තුනක් ( සකන්ධ තුන කිව්වහම වේදනාව සංඥාව සංඛාර හරි සංඥා සංඛාර විඤ්ඤාණ හරි කුමන හෝ සකන්ධ තුනක්)

**එකස්ස ඛන්ධස්ස** = එක් ස්කන්ධයකට සහ

**චිත්තසමුට්ඨානානඤ්ච රූපානං** = එත් එක්කම පහළ වෙනා වූ චිත්ත සමුට්ඨානික රූපයන්ට

**සහජාතපච්චයෙන පච්චයො** = එකට පහළ වීම වශයෙන් එකට හට ගැනීම් වශයෙන් සහජාත භාවයෙන් ප්‍රත්‍යය වෙනවා.

මේක මෙහම කියන්න තව හේතුවකුත් තිබෙනවා, ඒකත් අපි මෙහෙම හිතමු.

- **ද්වෙ ඛන්ධා ද්වින්නං ඛන්ධානං චිත්තසමුට්ඨානානඤ්ච රූපානං සහජාතපච්චයෙන පච්චයො.**

**ද්වෙ ඛන්ධා** = ස්කන්ධ දෙකක් (වේදනා සංඥා දෙක සංඛාර විඤ්ඤාණයන්ට හෝ සංඛාර විඤ්ඤාණ ස්කන්ධ දෙක වේදනා සංඥාවන්ට හෝ සංඥා සංඛාර දෙක වේදනා චිත්තයට හෝ වේදනා විඤ්ඤාණ දෙක සංඥා සංඛාරයන්ට හෝ)

**ද්වින්නං ඛන්ධානං -** අනිත් ස්කන්ධ දෙකට සහ

**චිත්තසමුට්ඨානානඤ්ච රූපානං** = ඒ වේලාවට චිත්තසමුට්ඨානික රූප හැටියට ඒ සිතට අදාළව පහළ වෙන රූපයන්ට

**සහජාතපච්චයෙන පච්චයො** = සහජාත භාවයෙන් ප්‍රත්‍යය වෙනවා.

මේ කොටස අතිශය ගාම්භීර කොටසක්. මෙච්චර මේ එක එක පැතිවලට කඩලා දේශනා කරන්නේ ඇයි? එක එක පැතිවලට කඩලා මතුකරන්නේ උලුප්පවලා දෙන්නේ ඇයි? මේ හේතු ඵල ධර්මය ඒ තරම් සියුම් වූ ඒ තරම්ම මෘදු වූ ඒ තරම්ම ගාම්භීර වූ අවබෝධයට හරිම දුෂ්කර වූ ධර්ම කොට්ඨාසයක්. ඒක නිසා ඒ වගේ ධර්ම මනසිකාරයක් පවත්වන්න හොඳ සියුම් වූ සිතක් හදාගන්න සුතමය ඥානය වශයෙන් ගලපා ගලපා බලන්න චින්තාමය ඥානය වශයෙන් හොඳට යෝනිසෝ මනසිකාරය දාලා ගලපා ගලපා බලන්න ඒවගේම භවනාමය ඥානය වශයෙන් හරියටම එතනට ගිහිල්ලා ස්පර්ශ කරලා බලන්න පුළුවන් විදියට තමයි දේශනා කරලා තිබෙන්නේ. මේකේ පරම අර්ථය තමයි, විශේෂයෙන්ම සත්වයන්ගේ හිත්වල තිබෙනවා පුද්ගල සංඥාව, ආත්ම සංඥාව හරියට තිබෙනවා. ඒක ගලවන්න අමාරුයි. ඒක නිසා මේවා පුද්ගලයෝ නොවෙයි. මේවා ආත්ම නොවෙයි. මේවා ඔවුනොවුන්ට උපකාර වී පවතින්නා වූ ඔවුනොවුන්ට හේත්තු වෙලා නිශ්‍රය වෙලා සහජාත වෙලා එකට උපකාර වෙන්නා වූ ආත්ම ගුණයක් නැති, පුද්ගල ගතියක් නැති, හේතු ඵල ධර්ම හැටියට පහළ වෙන්නා වූ ධර්ම කණ්ඩයක් බව මුලා වූ ලෝකයාට කියලා දීලා ආත්ම සංඥාව අයින් කරලා නිර්වාණ ධාතුව ස්පර්ශ

කරවන්න තමයි මෙච්චර මේ ගොඩාක් විස්තර හැටියට කඩ කඩා මේ දේශනා කරලා තිබෙන්නේ.

තවත් හොඳට මෙනෙහි කළයුතු ධර්ම කොටසක් අපි ගමු.

- **පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතො එකො ඛන්ධො තිණ්ණන්නං ඛන්ධානං කටත්තා ච රූපානං සහජාතපච්චයෙන පච්චයො.**

රූපයක් ගැන කියවෙනවා නම් ඒකාන්තයෙන්ම ඒ පංචවෝකාරයම තමයි.

**පටිසන්ධික්ඛණෙ** = ප්‍රතිසන්ධිය ඇතිවෙන්නා වූ ක්ෂණයේ

**විපාකාබ්‍යාකතො** = විපාක වශයෙන් ඉදිරිපත් වෙන අව්‍යාකෘතයට

**එකො ඛන්ධො** = එක ධර්මයක්.( 'වේදනාව' හෝ ප්‍රතිසන්ධි සිතේ පහළ වෙන 'සංඥාව' හෝ ප්‍රතිසන්ධි සිතේ පහළ වන්නා වූ 'සංඛාරය' හෝ ඒ 'විඤ්ඤාණ').

**තිණ්ණන්නං ඛන්ධානං** = තවත් සකන්ධ තුනකට සහ

**කටත්තා ච රූපානං** = ඒ සමගම පහළ වෙන්නා වූ රූපයන්ට

**සහජාතපච්චයෙන පච්චයො** = එකට පහළ වීම් වශයෙන් ප්‍රත්‍යය වෙනවා.

මෙතැන කටත්තා රූප කියලා කියනවා විපාක වශයෙන් පහළ වෙන රූපවලට. මෙතැනදි කියන්නේ නෑ චිත්තජ රූප කියලා. එහෙම කියන්නේ නැත්තේ ප්‍රතිසන්ධි අවස්ථාවේදී චිත්තජ රූප පහළ වෙන්නේ **නෑ.**

- **තයො ඛන්ධා එකස්ස ඛන්ධස්ස කටත්තා ච රූපානං සහජාතපච්චයෙන පච්චයො** = ස්කන්ධ තුනක් අනිත් ස්කන්ධයට සහ කර්මයෙන් හටගන්නා වූ රූපයන්ට සහජාත භාවයෙන් එකට ඉපදීම් වශයෙන් ප්‍රත්‍යය වෙනවා.

දැන් සමහර වෙලාවට තිබෙනවා අපිට තනි නොතනියක් නෑ කියලා. සමහර අවස්ථාවලදී මිනුස්සු හුදකලා පාරක යන්නේ නෑ. තනියෙන් කවුරුවත් නැති පාළු පාරක යන්න සැකයි. හැබැයි සමහර වෙලාවට තමන්ගේ නෑදෑයෝ නොවුනත් තමන්ගේ ගමේ රටේ අය නොවුනත් මිනිස්සු ඉන්නවා පාරේ. ඒ මිනිස්සු එන්නේ අපිට තනිකම් රකින්න නොවෙයි. ඒ මිනිස්සු වෙන වෙන තැන්වලට යන අය. ඒ උනාට පාරට බහින එක්කෙනාට පාළුවක් දැනෙන්නේ නෑ. අන්න එහෙම ගතියක් තිබෙනවා. එතකොට බයක් සැකක් නැතිව එයාට යන්න පුළුවන්. නමුත් ඒ මිනිස්සු ඇවිල්ලා කථා කරන්නෙත් නෑ. ඒ මිනිස්සු තනි රකින්න කියලා දෙන්නෙත් නෑ. නමුත් තමන්ගේ හිතට

ඒ මිනුස්සු පාරේ ඉඳීමම අමුතුම විදියේ බලයක් හදලා දෙනවා. ඒවගේ ස්වභාවයක් ඔය සමහර ධර්ම වල තිබෙනවා, එකට ඉපදීම් වශයෙන් එකට ඉන්නකොට අනිත් එක්කෙනාටත් පහළ වෙන්න පුළුවන්. දැන් සමහර අය කියනවා 'මම යන්නේ අයියා යනව නම්, අක්කා යනවා නම්' කියලා. එහෙම කියන්නේ එයාට ඒකෙ ගැම්මක් තිබෙනවා. ආන්න ඒ වගේ සහජාත කියන්නේ එකට උපදිනවා. එකට උපදින කොට ඒ ඒ රූප ධර්මවල නාම ධර්මවල තිබෙනවා ඔවුනොවුන්ට ප්‍රත්‍යය වෙන්නා වූ උපකාර කරගන්නා වූ එකට ඉපදීම් වශයෙන් ගුණයක් දක්වන ගතියක්. ඒ ගතිය තමයි අපි සහජාත ප්‍රත්‍යය හැටියට ඉගෙන ගන්නේ.

- **ද්වෙ ඛන්ධා ද්වින්නං ඛන්ධානං කටත්තා ච රූපානං සහජාතපච්චයෙන පච්චයො** = ස්කන්ධ දෙකක් තවත් ස්කන්ධ දෙකකට සහ විපාක වශයෙන් ඉදිරිපත්වෙන රූපයන්ට සහජාත භාවයෙන් ප්‍රත්‍යය වෙනවා උදව් වෙනවා උපකාර වෙනවා.

- **ඛන්ධා වත්ථුස්ස සහජාතපච්චයෙන පච්චයො** = ස්කන්ධයෝ හතරදෙනාම (වේදනා සංඥා සංඛාර විඤ්ඤාණ යන හතර දෙනා) මූල රූපය වූ හෘදය වස්තු රූපයත් එක්ක උපදිනවා. හෘදය වස්තු රූපයට (වත්ථුස්ස) සහජාත භාවයෙන් ශක්තියෙන් උදව් වෙනවා, උපකාර වෙනවා.

කෙනෙක් උපදින වේලාවේ ඇත්ත වශයෙන්ම අපි අද කථා කරන්නා වූ හෘදය වස්තු රූපය වගේ එකක් නෑ. ප්‍රතිසන්ධිය ගන්න අවස්ථාවේදී තිබෙන්නේ පොඩියට. ඒවෙලාවට ලේ pump කරන්න පුළුවන් එකක් තවම හැදිලා නෑ. නමුත් මේ වස්තු රූපය කියලා කියන්නේ නාම ධර්මයන්ට ඉන්න උදව්වෙන මූලිකම යම් කිසි රූපමය ගුණ ස්වභාවයක්. ඒකටයි මෙතැන වත්ථුස්ස කියලා කියන්නේ.

- **වත්ථු ඛන්ධානං සහජාතපච්චයෙන පච්චයො** = හෘදය වස්තුව අනිත් නාම ධර්ම හතරටම තමන් ආශ්‍රයේ උපදින්න සහජාත භාවයෙන් උපකාර කිරීම් වශයෙන් පිහිට වෙනවා. ප්‍රත්‍යය වෙනවා.

රූප ධර්ම පිළිබඳව නාම ධර්ම සමග යම් අතගැසීමක් උනොත් ඒකාන්තයෙන්ම ඒ ජීවිතිය පංචවෝකාර භවයක වෙනවා. නාම ධර්ම නැතුව යම් කිසි විදියකින් රූප කථාවක් කළොත් ඒ අසංඥ තලයේ පමණයි. මේ විදියට ඔවුනොවුන්ට සහජාත භාවයෙන් උදව් වෙනවා උපකාර වෙනවා. මෙතෙක් අපි කථා කළේ රූපයයි නාමයයි දෙක මිශ්‍රවෙන විදිය. ඉස්සෙල්ලාම කිව්වා නාම ධර්මයන් නාම ධර්මයන්ට සහජාත භාවයෙන් උපකාර වෙන විදිය.

- **එකං මහාභූතං තිණ්ණන්නං මහාභූතානං සහජාතපච්චයෙන පච්චයො.**

මහා භූත කියලා කියන්නේ රූප කොටස්. පඨවි ආපෝ තේජෝ වායෝ යන හතර.

**එකං මහාභූතං** = එක මහා භූත ධර්මයක් හැටියට ‘පඨවි’ ධාතුව ගත්තොත්

**තිණ්ණන්නං මහාභූතානං** = ඉතිරි ‘අපෝ’ ‘තේජෝ’ ‘වායෝ’ යන භූත ධර්ම තුනට

**සහජාතපච්චයෙන පච්චයො** = එකට ඉපදීම් වශයෙන් උදව් වෙනවා උපකාර වෙනවා.

දැන් එක ක්‍ෂණයක තමයි ඔය රූප පහළ වෙන්නේ. මේ රූප තනි තනියෙන් පහළ වෙන්නේ නෑ. පඨවි උපදිනවා ඊළඟට ආපෝ උපදිනවා ඊට පස්සේ තේජෝ උපදිනවා ඊට පස්සේ වායෝ උපදිනවා කියලා එහෙම පිළිවෙලකට උපදින්නේ ඒවා නොවෙයි මේ රූප. මේවා එකට උපදින්නේ. එකට රූප උපදිනකොට, යම් කිසි තැනක වායෝ තිබෙනවද එතැන අඩුවෙන් හරි වැඩියෙන් හරි තිබෙනවා පඨවි ආපෝ තේජෝ. තේජෝ තිබෙන තැනක පඨවි ආපෝ වායෝ තිබෙනවා. ඔය විදියට එක මහා භූතයක් අනිත් මහා භූත ධර්ම තුනට සහජාත භාවයෙන් ප්‍රත්‍යය වෙනවා.

- **තයො මහාභූතා එකස්ස මහාභූතස්ස සහජාතපච්චයෙන පච්චයො** = මහා භූත ධර්ම තුනක් තවත් එක මහා භූත ධර්මයකට සහජාත භාවයෙන් ප්‍රත්‍යය වෙනවා.

එක්කෙනෙක් තුන් දෙනෙකුට සහජාත වෙනවා. තුන්දෙනෙක් එක්කෙනකුට සහජාත භාවයෙන් ප්‍රත්‍යය වෙනවා. ඒක එහෙම වෙන්න එපායැ. දැන් අපි කිව්වානේ මේසයක් ගැන. ඒ මේසයේ එක මේස කකුලක් අනිත් තුන් දෙනාගේම උදව්ව එක වෙලාවේම ලබනවා, එක අතකට ගත්තම. ඒවාගේම තමයි එක වෙලාවේම අනිත් තුන්දෙනාට මෙයා උදව්වෙනවා බර දරා ගැනීමට. මේස කකුල් දෙකක් දෙපැත්තේ ඉඳගෙන අනිත් දෙන්නට උදව් කරනවා. ඒ වගේ තමයි මේ.

- **ද්වෙ මහාභූතා ද්වින්නං මහාභූතානං සහජාතපච්චයෙන පච්චයො** = මහා භූත ධර්ම දෙකක් මහා භූත ධර්ම දෙකකට උදව් වෙනවා සහජාත භාවයෙන්. එකට ඉපදීම් වශයෙන්.

- **මහාභූතා චිත්තසමුට්ඨානානං රූපානං උපාදාය රූපානං සහජාතපච්චයෙන පච්චයො**

චිත්ත සමුට්ඨානික රූප තිබෙනවා 14 ක්. ආකාස රූපයත් එක්ක 15 කියලා කිව්වා. අපි 14 කියලා ගමු. ඒ 14 ගත්තම ඒකෙ පඨවි ආපෝ තේජෝ වායෝ යන සතරෙන් එකක් එක වෙලාවක ඒ වේලාවේ පහළ උනා වූ අනිත් චිත්ත සමුට්ඨානික රූපයන්ට වගේම උපාදාය රූප වලට සහජාත භාවයෙන් උපකාර වෙනවා.

උපාදාය රූප කියලා කියන්නේ මහා භූත නොවෙන්නා වූ අනිත් රූප ටිකට. චිත්ත සමුට්ඨානික රූප 14 කිව්වොත් ඒ රූප 14 න් 4 ක් මහා භූතයි. අනිත් 10 උපාදායයි, චිත්තජ වශයෙන් ගත්තම. මේ එක මහා භූත රූපයක් අනිත් චිත්ත සමුට්ඨානික රූපයන්ටත් උපාදාය රූපයන්ටත් සහජාත භාවයෙන් උපකාර වෙනවා. කවදාකවත්ම ලොකු අය පහළ උනාට පස්සේ නොවෙයි පොඩි අය පහළ වෙන්නේ. මේ ප්‍රත්‍යයේ හැටියට පහළ වෙන්නේ ඔක්කොම එකටයි. ගෙදරක කෑම කන වෙලාවේදී සමහර අවස්ථා තිබෙනවා කට්ටිය ඔක්කොම එකට ඉඳගෙන කෑම කනවා. සමහර අවස්ථා වලදී වැඩිහිටියෝ

කාල ඉවර උනාට පස්සේ අනිත් අය කෑම කන්නේ. මේකේ තිබෙන්නේ එහෙම නොවෙයි. මේකේ තිබෙන්නේ ඔක්කොම ටික එකට පහළ වෙන එක.

අනිත් එක තමයි බාහිර රූප සම්බන්ධයෙන් කියවෙන තැනක් තිබෙනවා.

- **බාහිරං එකං මහාභූතං තිණ්ණන්නං මහාභූතානං සහජාතපච්චයෙන පච්චයො** = බාහිරව පහළ වෙන්නා වූ එක් මහා භූත ධර්මයක් (ඒක පඨවි වෙන්න පුළුවන් ආපෝ වෙන්න පුළුවන් තේජෝ වෙන්න පුළුවන් වායෝ වෙන්න පුළුවන්) අනිත් මහා භූත ධර්ම තුනට එකට ඉපදීම් වශයෙන් එකට පහළ වීම් වශයෙන් උදව් වෙනවා උපකාර වෙනවා.

  ඉස්සරවෙලා මම කිව්වේ චිත්තජ කාණ්ඩය. දැන් මේ කියන්නේ බාහිර රූප සම්බන්ධයෙන් ඇති වෙන්නා වූ රූප පිළිබඳව.

- **තයො මහාභූතා එකස්ස මහාභූතස්ස සහජාතපච්චයෙන පච්චයො** = බාහිර රූප වල තිබෙන මහා භූත ධර්ම තුනක් එක මහා භූත ධර්මයකට උදව් වෙනවා.

- **ද්වෙ මහාභූතා ද්වින්නං මහාභූතානං සහජාතපච්චයෙන පච්චයො** = මහා භූත දෙකක් තවත් මහා භූත දෙකකට සහජාත භාවයෙන් ප්‍රත්‍යය වෙනවා.

- **මහාභූතා උපාදාරූපානං සහජාතපච්චයෙන පච්චයො** = මහා භූත ධර්මයෝ උපාදාය වශයෙන් පහළ වෙන්නා වූ රූප ධර්මයන්ට ප්‍රත්‍යය වෙනවා එකට ඉපදීම් වශයෙන්.

මේ සහජාත ධර්ම ඉදිරිපත් කිරීම තුල මේ විග්‍රහය චින්තාමය වශයෙන් ගත්තහම ‘මේක මෙහෙමත් පහළ වෙනවා, මෙහෙමත් පහළවෙනවා, ප්‍රතිසන්ධි අවස්ථාවේ රූප කොට්ඨාස මේ විදියටත් පහළ වෙනවා’ කියලා අපිට හොඳ චිත්ත රූප පහළ වෙනවා. මේ පින්වතුන්ට මතක ඇති අපි එක අවස්ථාවක

කිව්වා සුද්ධ මනෝද්වාරය සහ මිශ්‍රක මනෝද්වාර කියලා විස්තරයක්. සුද්ධ මනෝද්වාරික කියලා කියන්නේ මනසේම පහළ වෙන සිත් පේළි. අපි එක පාරක් යම් කිසි ධර්ම කාරණයක් ඇහුවොත් ඒ ධර්ම කාරණය අහල ඉවර උනාට පස්සේ අපිට ඒ අහපු දේ සම්බන්ධයෙන් විසාල සිත් පෙළක්, විසාල චිත්ත වීථි ගොඩක් ඒ අහපු දේ සම්බන්ධයෙන් පහළ වෙනවා. දැන් අපි මේ වෙලාවේ දිගට කියාගෙන ගියේ සහජාත භාවයෙන් නාම ධර්ම සහ රූප ධර්ම පහළ වෙන, මතු වෙන හැටි.

අපි තැන් කීපයක් කිව්වා. ඒ තමයි ප්‍රතිසන්ධි අවස්ථාව. ප්‍රවෘත්ති අවස්ථාව. ප්‍රතිසන්ධි අවස්ථාවේදී කොහොමද ස්කන්ධ එකක් අනිත් ස්කන්ධ තුනට සහජාත වෙන්නේ කියලා කිව්වා. සකන්ධ තුනක් එක නාමයකට කොහොමද සහජාත වෙන්නේ කියලා. ඊළඟට ස්කන්ධ දෙකක් අනිත් ස්කන්ධ දෙකටත් ඊළඟට කටත්තා රූප කියන විපාක රූපයටත් කොහොමද සහජාත භාවයෙන් ඉදිරිපත් වෙන්නේ කියලා කිව්වා. ඔය එක තැනක්. දැන් මේක පිළිබඳව හිත හිතා යනකොට සුද්ධ මනෝද්වාරික චිත්ත වීථි පහළ වෙනවා. ඒ කියන්නේ ප්‍රතිසන්ධි අවස්ථාව අල්වාගෙන ප්‍රතිසන්ධි අවස්ථාව මුල් කරගෙන එක නාම ධර්මයක් අනිත් තුනට, නාම ධර්ම තුනක් අනිත් එකට, නාම ධර්ම දෙකක් තව දෙකකට, නාම ධර්ම දෙක අනිත් දෙකට, ඊළඟට එක නාම ධර්මයක් අනිත් නාම ධර්ම තුනටයි රූපයන්ටයි සහජාත වෙන ආකාරය මෙනෙහි කරන්න යම් කිසි වෙලාවක පුළුවන් නම් එතනදී හැදෙන්නේ අපි අහපු දේශනාවකට අනුකූලව චිත්තජ රූපයක් මැවිලා ප්‍රතිසන්ධි අවස්ථාවක් සිතෙන් හදාගෙන එයට අනුකූලව සිතින් මෙනෙහි කිරීම වශයෙන් දැන ගැනීම වශයෙන් මහා විශාල සිත් පෙළවල් පහළ වේගෙන පහළ වේගෙන යනවා. ඒ අතර ඒ පහළ වෙන තැන බලන්නේ **සහජාත භාවය** කොහොමද මෙතැනදී ක්‍රියාත්මක වෙන්නේ කියලා. ඔය එක තැනක්. මේ අවස්ථාවේදී වෙන මොකක්වත් අපේ හිතට දැනේන්නේ නෑ. හිතෙන්නේ නෑ. ප්‍රතිසන්ධි අවස්ථාවේදී සහජාත ප්‍රත්‍යය තිබෙන තැනයි සහජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය ලබාගන්නා ප්‍රත්‍යය උප්පන්න යයි විතරයි අපිට අහුවෙන්නේ, හිතට දැනෙන්නේ, හිතට වැටෙහෙන්නේ. මේ ප්‍රතිසන්ධි අවස්ථාව.

ඊළඟට තව තැනක් තිබෙනවා. ඒ තමයි ප්‍රවෘත්ති අවස්ථාවේ ක්‍රියා සිත් පහළ වෙන තැන. රහතන්වහන්සේගේ ක්‍රියා සිතක් පහළ වෙන්නේ කොහොමද ඒක සහජාත වෙන්නේ කොහොමද කියලා අපිට මනෝද්වාරික සිත් පෙළකින් රහතන්වහන්සේ කෙනෙකුගේ සිත මේ විදියටයි කියලා හිතා ගන්න පුළුවන්. එවිට දිගටම යන්නේ මිශ්‍රක නොවෙයි සුද්ධ මනෝද්වාරික සිත් පේළි.

ඊළඟට චිත්තජ රූප පහළ වීම. ඊළඟට විපාක වාරයේ සිත් පහළ වෙන අවස්ථාව, ක්‍රියා සිත් පහළ වෙන අවස්ථාව ඊළඟට ධර්මතා දෙකක් තව ධර්මතා දෙකකට, ධර්මතා තුනක් එකකට, ධර්මතා එකක් තවත් ධර්ම තුනකට ප්‍රත්‍යය වෙන ආකාරය මේ කියපු ආකාරයට තැන් තැන් වල නැවතී නැවතී මේ ධර්ම වල තිබෙන්නා වූ සහ සහයෝගීතාව මෙනෙහි කර කර මෙනෙහි කර කර මෙහෙම වෙන්නේ ඇයි කියන ප්‍රශ්නය අපේ සිතෙන් ගොඩ නැගුවහම අපිට තේරෙනවා කවදාකවත් මේ ධර්ම තනියෙන් හුදකලා වෙලා පහළ වෙන්න පුළුවන් ගතියක් තිබෙන අය නොවෙයි කියලා.

දැන් බලන්න මේ ආලෝකය. ආලෝකයක් පහළ වෙච්ච ගමන් ඒ ආලෝකය වර්ණයක් අපිට ගහගෙන යනවා. එළිය කරලා යනවා. එක වේලාවේම අපිට වටපිටාවේ තිබෙන දේවලුත් මතු කරලා පෙන්නලා ආලෝකයකුත් එක්තරා පාටකට මතුවෙලා යනවා. ඒ තමයි හැටි. ඒ වගේ මේ ස්ථාන එනම් ප්‍රතිසන්ධි අවස්ථාව ප්‍රවෘත්ති අවස්ථාව විපාක සිත් පහළ වෙන අවස්ථාව ඒවගේම ක්‍රියා අව්‍යාකෘත ධර්ම ඊළඟට මේ ස්ථාන පිළිබඳව හොඳට මෙනෙහි කරගෙන ඊළඟට චිත්තජ රූප ඍතුජ රූප මෙනෙහි කරගෙන යනකොට මේවා හරියට හිත ඇතුලේම සකස් වෙන්නා වූ ආරම්මණික වශයෙන් භාවනා මධ්‍යස්ථාන වගෙයි. භාවනාවකට අරමුණු ගොනුකරගෙන මෙනෙහි කරන මනසිකාර මණ්ඩලයක් වගෙයි. මනසිකාර ස්ථානයක් වගෙයි. මෙනෙහි කරන්න විදර්ශනාවක් හැටියට දකින්න බලන්න හොඳ සුද්ධ වූ තැනක් වගෙයි. මෙතනින් බලන්නේ ස්කන්ධයන්ගේ ආකාරය මිසක එතෙන්ට ගිහිල්ලා සත්ව පුද්ගල ඇඳීමක් කරලා නොවෙයි. ඒක නිසා මේ ගාම්භීර ධර්ම කොට්ඨාසය හරියට භාවනා මනසිකාරයක් ඇති කරගන්න හොඳ පිහිටක් වෙනවා. අපි ඇත්තටම මහා මුලාවක් ඉන්නේ. මුලාව ගලවාගන්න බැරුව කඩාගන්න බැරුව තමයි අපි හැම එක්කෙනාම අසරණ වෙලා අතරමං වෙලා ඉන්නේ.

මොකක්ද ඒ මුලාව? අපේ හිතේ තිබෙන්නා වූ පුද්ගල හැඟීම පුද්ගල සංඥාව ආත්ම හැඟීම ආත්ම සංඥාව. අපි හිතාගෙන ඉන්නවා මේක තේරුණා කියලා. හැබැයි තේරිලා නෑ. වැටහිලා නෑ. අපිට වැටහිලා තිබෙන්නේ අහපු දේකට කියපු දේකට අනුකූලව අපිට යම් කිසි සුතමය දැනුමක් විතරයි තිබෙන්නේ. එහෙම නැතුව අපිට ප්‍රත්‍යක්ෂ වෙලා නෑ. ඒ ප්‍රත්‍යක්ෂව අවබෝධ වෙච්ච නැති නිසා අපිට පුදුම දූකකට මේ හේතු ඵල ධර්ම රාමුවේම ගැට ගැහෙන්න වෙලා තිබෙනවා.

මේ අපි කථා කරන සහජාත ධර්ම එකට උපදින ධර්ම එකට උපදින තැන් ගොනුකරලා තමයි ඔය පාලි වාක්‍යය වලින් පෙන්නන්නේ. මෙතැනත් එකට උපදින තැනක් , මෙතැනත් එකට උපදින තැනක් කියලා මේ විදියට කිය කියා කිය කියා මෙනෙහි කරන්ට තැන් පෙන්නවා මේ පාලි පාඨ හරහා. ගාම්භීර වූ විසිතුරු වූ ධර්ම කොට්ඨාසයක් මේ කථා කරන්නේ. සාකච්ඡා කරන්නේ. ඒ නිසා සැම දෙනාටම අද බොහොම මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා මේ ධර්ම හොඳට පැහැදිලිව විසිතුරුව එකින් එකට පටලවා ගන්නේ නැතුව ඒවාගේම මිශ්‍ර කරගන්නේ නැතුව හොඳට මෙනෙහි කරගෙන ගිහිල්ලා සැමදෙනාටම චතුරාර්ය සත්‍යය ධර්මයන් ඔය තැනකදී අවබෝධ කරගෙන හේතු ඵල ධර්මයන්ගේ තිබෙන භයානකත්වය තේරුම් අරගෙන හේතු ඵල ධර්මයන්ගේ තිබෙන නිස්සාරත්වය තේරුම් අරගෙන හේතු ඵල ධර්මයන්ගෙන් මිදිලා හේතු ඵල ධර්මයන්ට කිසිම වේලාවක කැමැත්තක් ඕනෑකමක් ආසාවක් බැඳීමක් පැතීමක් ඇලීමක් ඇතිකර ගන්නේ නැතුව හේතු ඵල ධර්ම කියන්නා වූ නාම ධර්ම වලින් හිත ගලවාගෙන මුදවාගෙන රූප ධර්මයන්ගෙන් හිත ගලවාගෙන මුදවාගෙන අයින්වෙලා මේ රූප ධර්ම ගොඩෙන් නාම ධර්ම ගොඩෙන් අයින්වෙලා ඉවත්වෙලා එකම එක ධර්මයක් වෙන ශාන්ත වූ ධර්මයක් වෙන ප්‍රණීත වූ ධර්මයක් වෙන නිර්වාණ ධාතුව කියන ධර්මය ප්‍රඥාවෙන් සපර්ශ කරලා ප්‍රඥාවෙන් අවබෝධ කරගෙන නිවනෙන්ම නිවී සැනසී යන්න ලැබේවා! ඒ සඳහා මේ උතුම් ධර්මය ආධාර උපකාර වේවා! කියලා මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා. ආශිර්වාද කරනවා. සැමදෙනාටම තෙරුවන් සරණයි!

සාධු! සාධු! සාධු!

<u>ප්‍රශ්නයක්</u> - ස්වාමීන්වහන්ස ඔබ වහන්සේ අපිට කියලා දීපු රූප කොටස් ටිකේ උපාදින්න රූපයි නිෂ්පන්න රූපයි කියලා කොටස් දෙකක් අපිට හම්බවෙනවා. එතකොට තේරුම් අරගෙන ඉන්නවා ස්වාමීන්වහන්ස උපාදින්න කියනකොට ඒක කර්මයෙන් ඇතිවෙච්ච රූප කියලා. ඔබවහන්සේ අපිට පැහැදිලි කළා වගේ ශුද්ධ අෂ්ඨකයත් ප්‍රසාද රූප 5 හත් ස්ත්‍රී භාව රූපය පුරුෂ භාව රූපය හෘදය වස්තු රූපය ආකාස රූපය කියන කොටස් ටිකයි ගන්නේ කොටස් 18 ක් හැටියට. නිෂ්පන්න කියන කොට ස්වාමීන්වහන්ස අහල තිබෙන විදියට අපි අනිත්‍යය දුක්ඛ අනාත්ම බලනවා නම් ඒ වගේ භාවනාවකට යොදා ගන්න පුළුවන් රූප ටික අර කලින් කියපු 18 ආකාස රූපය ඉවත්වෙලා එතනට ශබ්ද රූපය ඇතුලත් වෙනවා කියන අදහසක් තිබෙනවා ස්වාමීන්වහන්ස. ඒක වැරදි නම් නිවැරදි කරලා දෙනවා නම් බොහොම පිං ස්වාමීන්වහන්ස.

<u>පිළිතුර</u> - මේ ගැන අපේ පින්වත් සැම දෙනාටම අපේ ජයන්ත මහත්මයා අහපු නිසා අපි මේ කරුණු ටික කියනවා. නිෂ්පන්න රූප කියලා අපි රූප 18 ක් හඳුනා ගන්නවා. නිෂ්පන්න රූප කියලා කියන්නේ කර්ම ආදී ප්‍රත්‍යය ධර්මයන්ගෙන් හටගත්ත රූප කියන එකයි නිපදවෙච්ච රූප කියන එකයි නිෂ්පන්න රූප කියලා ඔය කියන්නේ. ඒක ඇත්ත වශයෙන්ම ප්‍රධාන රූප ටිකක්. ඒ තමයි ..

පඨවි + ආපෝ + තේජෝ + වායෝ + චක්ඛු ප්‍රසාදය + සෝත ප්‍රසාදය + ඝාණ ප්‍රසාදය + ජිව්හා ප්‍රසාදය + කාය ප්‍රසාදය + වර්ණ + ගන්ධ + රස + ඕජා + ආකාශ ධාතුව + හෘදය වත්ථු රූපය + ජීවිතින්ද්‍රිය රූපය + ස්ත්‍රී භාව රූපය + පුරුෂ භාව රූපය = 18

මේ රූප 18 කර්මය හේතුකරගෙන හැදිච්ච නිසා සහ ප්‍රත්‍යය මුල් කරගෙන හැදිච්ච නිසා මේවාට කියනවා නිෂ්පන්න රූප කියලා. මේ නිෂ්පන්න රූප 18 තවත් යම් යම් අවස්ථාවලදී භාවිතා කරන වචන කීපයක් තිබෙනවා. ඒකත් ඇත්ත වශයෙන්ම දැන ගන්න එක හොඳයි. එකක් තමයි මේවාට කියනවා ස්වභාව රූප කියලා. ස්වභාව රූප කියලා කියන්නේ මේ රූප 18 ගත්තම ඒවා

එකින් එකට වෙනස්. කවදාකවත්ම එක සමාන රූප දෙකක් නෑ. ‘පඨවි’ කියන රූපයට තිබෙන ලක්ෂණය ‘ආපෝ’ කියන රූපයට එකට නෑ. ‘ආපෝ’ කියන එකට තිබෙන ලක්ෂණය ‘තේජෝ’ වලට නෑ. ‘තේජෝ’ වලට තිබෙන ලක්ෂණය ‘වායෝ’ වලට නෑ. ‘වායෝ’ වල ලක්ෂණය චක්ඛුවේ නෑ. ඇසේ තිබෙන ලක්ෂණය සෝතයේ නෑ. ඒ නිසා තනි තනියෙන් තනි තනියෙන් එක එක්කෙනාට වෙනස් වෙච්ච බොහෝම distinct characteristics තිබෙන්නේ මේවාට. විශේෂිත අමුතු විදියේ ස්වභාව දරන නිසා තමන්ටම ආවේනික ලක්ෂණ දරන නිසා ඒවාට කියනවා **ස්වභාව රූප** කියලා. ඊළඟට තව වචනයක් තැන් තැන් වල පාවිච්චි කරනවා. මේ හැම එකකම තිබෙනවා තවත් පොදු ලක්ෂණයක්. පඨවි ඇති උනොත් නැති වෙලා යනවා. ආපෝ ඇති උනොත් නැති වෙලා යනවා. වායෝ ඇති උනොත් නැති වෙලා යනවා. තේජෝ ඇති උනොත් නැති වෙලා යනවා. මේවා හැම එකක්ම ඇතිවෙලා නැතිවෙලා යනවා. මේවාට මේ ඇති වී නැති වී යන්නා වූ ලක්ෂණය තිබෙන නිසා ඒ ලක්ෂණයෙන් ගැවසී ගත්ත නිසා ඒවාට කියනවා **ලක්ෂණ රූප** කියලා. තවත් එකක් තිබෙනවා. මේවා වෙනස් වෙලා විකුර්ති වෙලා නැතිවෙලා යනවා. මේවා රුප්පන ගතියෙන් යුක්ත වෙච්ච නිසා **රූප රූප** කියලා කියනවා. ඊළඟට භාවනා කරන්න ගියහම මේ රූප සම්මර්ශනය කරන්න, බලන්න, මෙනෙහි කරන්න කියලා කියන නිසා මේවාට **සම්මර්ශන රූප** කියලත් කියනවා.

මේ විදියට මේ නිෂ්පන්න රූප 18 ට **ස්වභාව රූප** කියලා කියනවා. **ලක්ෂණ රූප** කියලා කියනවා. **රූප රූප** කියලා කියනවා. **සම්මර්ශන රූප** කියලා කියනවා. මේකත් අපේ පින්වතුන් දැනගෙන තිබෙන එක හොඳයි. ඔය අපේ මහත්තයා කියපු හැටියට නිෂ්පන්න රූප කියලා කියන්නේ ඔය ප්‍රත්‍යයෙන් හටගන්නා වූ රූප කියන එකයි.

ප්‍රශ්නය - අවසරයි ස්වාමීන්වහන්ස අපි දැන් කථා කළා **අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස සහජාතපච්චයෙන පච්චයො** කියන එක. ඒ පාලි පාඨයත් **අබ්‍යාකතං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති සහජාතපච්චයා** කියන එකයි දෙකම එකද ස්වාමීන්වහන්ස?

<u>පිළිතුර</u> - ඔව් ඒකේ තිබෙන්නේත් අපි කියපු ටිකම තමයි.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස අපි ඍතුජ රූප කොටස් දෙකකට බෙදා ගත්තා පට්ඨානෙට එද්දී බාහිර රූපයයි ඍතුජ රූපයි කියලා. දැන් කර්මජ රූප වල නම් අපිට වෙන් කරගන්න පුළුවන් ප්‍රතිසන්ධි - අසංඥ - ප්‍රවෘත්ති කියලා. ඒක තුනකට වෙන් කරගත්තු එක තේරෙනවා. හැබැයි ඍතුජ රූප සහ බාහිර රූප කියලා දෙකට බෙදපු එකෙන් අදහසක් එන්නේ නෑ ඍතුජ රූප මොනවාද බාහිර රූප මොනවාද කියලා. දෙකම එක වගේ කියලා තමයි අදහසක් එන්නේ.

<u>පිළිතුර</u> - රූප තිබෙනවා මෙහෙම 1) චිත්තජ රූප 2) ප්‍රතිසන්ධි කර්මජ රූප. ඊට පස්සේ 3) බාහිර රූප කියලා තිබෙනවා. ඊළඟට 4) ආහාරාජ රූප තිබෙනවා. 5) ඍතුජ රූප තිබෙනවා. තව තිබෙනවා 6) අසංඥ සත්ව කර්මජ රූප කියලා තිබෙනවා. 7) ප්‍රවෘත්ති කර්මජ රූප කියලා තිබෙනවා. රූප ආකාර 7 ක් තිබෙනවා.

හොඳටම තේරුම් ගන්න ඕනෑ ඒකෙදි බාහිර රූප හැටියට සඳහන් කරන්නේ මහත්තයා අපි අපේ කියලා තමන්ගේ කියලා කථා කරන්නේ නැතිව අජ්ජත්තයක් කිට්ටු කරගන්නේ නැතිව පිටට දාල තිබෙන්නා වූ ඒවා තමයි බාහිර රූප හැටියට සලකන්නේ, විශේෂයෙන්ම. තමන්ගෙන් අයින් වෙච්ච සත්ව නොවන්නා වූ බාහිරව තිබෙන්නා වූ රූප කොටස.

මෙහෙම කියන කොට හිතෙන්න පුළුවන් ඍතුජ රූප මොනවාද කියලා. ඍතුජ රූප කාණ්ඩයක් ඇත්ත වශයෙන්ම අපි වෙන්කර ගන්නවා. ඒ උනාට සමහර තැන් වලදී ඍතුජ රූප හැටියට ගන්නේ විශේෂයෙන්ම තේජෝ ධාතුව. මේ රූප ධර්ම 7 පිළිබඳවත් විශේෂයෙන් වෙනම පාඩමක් කරන්න ඕනෑ කියලත් මට හිතෙනවා. මේක නැතුව හසුරවන්න අමාරුයි. ඒක නිසා බාහිර රූප හැටියට ගන්නේ තමන්ගේ කියලා සලකන්නේ නැති රූප ටික.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස අද අපි කථා කළා ප්‍රතිසන්ධි ක්ෂණයේදී වස්තු රූපය ගැන. දැන් අපි ආයතනය හයක් දන්නවා. එතකොට පංචවෝකාර

භවයක නම් පංචද්වාරයෙන් අරමුණු එන්නේ නැතිවෙලාවට සාමාන්‍යයෙන් වස්තු රූපය ආධාර කරගෙනම තමයි හිත් පහළ වෙන්නේ කියලා අපි හිතාගෙන ඉන්නේ. එතකොට ධ්‍යාන සිත් උනත් වස්තු රූපය ආධාර කරගෙන තමයි ඇතිවෙන්න පුළුවන් කම තිබෙන්නේ කියන එක හිතා ගන්න පුළුවන්. නිරෝධ සමාපත්තියක නම් හිත පහළ වෙන්නේ නැති නිසා එතන නම් ආයතන සම්බන්ධයක් නෑ කියලා තේරුම් ගන්න පුළුවන්. ඒ උනාට සමහර අරූප ධ්‍යාන වලදී අරූප ධ්‍යාන සිත් ඇත්තටම වස්තු රූපය සම්බන්ධ කරගෙනද පහළ වෙන්නේ කියන ගැටලුව මතු උනා. අනිත් එක සාමාන්‍යයෙන් වතුරේ ගිලුනහම අවස්ථාවක් තිබෙනවා හෘදය වස්තුවත් වැඩ කරන්නේ නැති. එතකොට ඒ අවස්ථාවේදීත් වස්තු රූපය ආධාර කරගෙන සිත් පහළ වෙන්න පුලුවන් අවස්ථාවක් තිබෙනවද? දැන් හදවත් බද්ධ කරන අවස්ථාවේදීත් එහෙම නම් වස්තු රූපය ආධාර කරගන්නේ නැතුව හිත් පහළ වෙන අවස්ථාවලුත් තිබෙනවද කියලා හිතන්න අවස්ථාවක් එනවා ස්වාමීන්වහන්ස. ඒ ගැන පොඩ්ඩක් පැහැදිලි කරන්න ස්වාමීන්වහන්ස. තෙරුවන් සරණයි!

<u>පිළිතුර</u> - හිත් පහළ වෙන්නේ හෘදය වස්තු රූපය ආධාර කරගෙනමයි. ලේ pump කිරීම නැවතුනා කියන එක සිත් පහළ වීමට බාධාවක් නොවෙයි. සාමාන්‍යයෙන් වතුරේ ගිලුනහමයි සිහිය නැති උනහමයි හදවත වැඩ කරන්නේ නැහැ කියන කථාවෙන් කියන්නේ muscles වල තිබෙන්නා වූ සංකෝචනාත්මක ක්‍රියාවලිය නැවතීමයි. ඒක නොවෙයි සිත් පහළ කරගන්න ආධාර කරගන්නේ. අපි මස් පොදියටත් කියනවා හෘදය කියලා. ඊට වඩා සියුම් වූ තැනක් මේ සිත පහළ වෙන්නා වූ හිතේ ගෙදර කියන්නා වූ වස්තු රූපය කියන එක. ඒක නිසා හිත් පහළ වීමට කිසිම බාධාවක් නෑ. ඒක ආධාර කරගෙනම තමයි සිත් පහළ වෙන්නේ.

අනිත් එක තමයි අරූපාවචර භාවනාව කරන වේලාවේදී අරූපාවචර සිත් පහළ වෙන්නේ හෘදය වස්තුව ඇසුරු කරගෙනමයි. එතැනදී හෘදය වස්තුව ඇසුරු කරගෙන අරූපාවචර සිත් පහළ උනාට එතැනදී අරමුණු කරන්නේ අරූපාවචර ධර්ම. දැන් අපි හිතමු අපි අනාපාන සතිය වඩනකොට පළවෙනි අවස්ථාවේදී ඒක මනෝද්වාරිකයි. රූපයක් ආරම්මණයක් වශයෙන් ඇසුරු

කරනවා. ඊට පස්සේ ඒක රූපාවචර ධ්‍යාන මට්ටමට යනකොට අනාපාන සති කායික අරමුණෙන් අයින්වෙලා මනෝමය නිමිත්තකට පෙරලෙනවා. මනෝමය නිමිත්තක් තමයි ඊළඟට අනාපාන සතිය හැටියට ක්‍රියාත්මක වෙන්නේ. ඒක භාවනා නිමිත්ත. එතකොටත් හෘදය වස්තු රූපය ආධාර කරගෙන තමයි ඒ මනෝමය අරමුණ අරමුණු කරන සිත් පහළ වෙන්නේ. ඊළඟට ඒක ඉක්මවා ගිහිල්ලා අරූපාවචර අරමුණක් ගන්නකොට ඒ කියන්නේ මනුස්සයෙක් අරූපාවචර භාවනාව කරනකොට ඒ මනුස්සයාට භාවනා ආරම්මණය හැටියට පහළ වෙන්නේ අරූපාවචර අරමුණු 4. එනම් ආකාසානඤ්චායතන අරමුණ විඤ්ඤාණඤ්චායතන අරමුණ ආකිඤ්චඤ්ඤායතන අරමුණ නෙවසඤ්ඤානාසඤ්ඤායතන අරමුණ. මේවා අරම්මණ වශයෙන් අරූපාවචරයි. හැබැයි අරූපාවචර අරමුණු 4 පහළ කරන්නා වූ සිත පහළ කරන්නේ හෘදය වස්තුව ආශ්‍රය කරගෙන. ඒ මෙහෙදී. මෙතැනින් අයින් වෙලා එයා උප්පත්ති වශයෙන් අරූපාවචර ලෝකයට ගියහම එතැනදී පහළ වෙන සිත අවස්තුකයි. වස්තු රූපයක් ආධාර කරගන්නේ නැතුව පහළ වෙන්නේ ප්‍රවෘත්ති සිත්. ඒක නිසා අරූපාවචර භාවනාව කරන වෙලාවේදී වස්තු රූපය ආධාර වෙනවා. එහෙට ගියාට පස්සේ ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති දෙකේදීම එයාට අවත්ථුක වෙනවා.

<u>ප්‍රශ්නය</u> - දැන් ස්වාමීන්වහන්ස අපි ආශ්වාස ප්‍රාශ්වාස කියලා කාය ප්‍රසාදයනේ අරමුණු කරගෙන යන්නේ. අනාපාන සතිය කරත්දී ඒ කාය ප්‍රසාදය තිබෙත්දීම ධ්‍යාන වලට යන්න පුලුවන්ද? ඒ කියන්නේ ආශ්වාස ප්‍රාශ්වාස මනෝමය අරමුණකට පරිවර්තනය නොවී ඒ කාය ප්‍රසාදයේම තිබෙත්දී පළවෙනි ධ්‍යානයට දෙවෙනි ධ්‍යානයට යන්න පුළුවන්ද? නැත්නම් ඒ ධ්‍යාන වලට කලින් කායප්‍රසාදයෙන් ගත්තු ඒ අරමුණ මනෝමය අරමුණකට පරිවර්තනය වෙනවද? එහෙම නම් කොයි වෙලේද ඒක පරිවර්තනය වෙන්නේ කියන එක පොඩ්ඩක් පැහැදිලි කරලා දෙන්න ස්වාමීන්වහන්ස.

<u>පිළිතුර</u> - අපි පිළිගත්ත ධ්‍යාන ක්‍රමයක් තිබෙනවා. පිළිගත්ත සමාපත්ති සංචරණය කරන්නා වූ ධ්‍යාන තිබෙනවා. ඒවාට සමවදින්න නම් කාය ප්‍රසාදය තිබෙන තැන ධ්‍යාන ලබන්න බෑ. එතැන ඉක්මවා යන්න ඕනෑ. අපි දැනගෙන තිබෙන දේවල් දැන් තමයි ප්‍රායෝගිකව එන්නේ. කාය විඤ්ඤාණය විපාක

විඤ්ඤාණයක්. ඒ විපාක විඤ්ඤාණයේ තිබෙන්නේ චෛතසික 7 යි. ඵස්ස වේදනා සංඥා චේතනා ඒකග්ගතා ජීවිතින්ද්‍රිය මනසිකාරය. ඒක නිසා ඇත්ත වශයෙන්ම ධ්‍යානයක් කියලා සලකන්නේ නෑ. හැබැයි අංග දෙකක් තිබෙනවා. එකක් තමයි ඒකග්ගතාවය සහ වේදනාව. ඊළඟට තව ටිකක් ඉස්සරහට ගියැන් පස්සේ පංචද්වාරාවජ්ජන වීථි දෙක තුනකුත් ඕකට කවලම් කරලා බැලුවොත් එහෙම එතනදී තිබෙන්නේ අනාපාන සතියේ කය සප්ර්ශ වෙලා ඊට පස්සේ අනාපාන සතිය කායද්වාරික වශයෙන් නාසයේ හැදෙන තැන බල බලා ඉන්නවා. එතකොට එකඟ භාවයකට යනවා. එක්තරා එකඟ භාවයක් ඒකෙ තිබෙනවා. නමුත් අපි කථා කරන සමාපත්ති සංවරණය කරන්න පුළුවන් වූ ධ්‍යානය එතැන තාම ඇවිල්ලා නෑ. තව ඉස්සරහට යන්න ඕනෑ.

තව ඉස්සරහට ගියැන් පස්සේ ඔය කයේ තිබෙන අරමුණෙන් හෙමිහිට අයින්වෙලා හරියට ඒක කියනවා නම් අපි පත්තු කරන හඳුන්කූරක් වගේ. හඳුන්කූරක් පත්තු කරහම ගින්දර හටගන්නේ හඳුන්කූරේ. හඳුන්කූරේ ගින්දර හටගත්තම එතනින් ඇතිවෙනවා දුමක්. හැබැයි ඒ දුම හඳුන්කූර ළඟ තියෙන්නේ නෑ. හඳුන්කූරෙන් අයින්වෙනවා. හඳුන්කූරෙන් අයින්වෙලා ටිකක් දුරට ගිහිල්ලා උඩ තුනී වෙලා යනවා. ඔය වගේ අනාපාන සති අරමුණ හරියට හඳුන්කූරේ ගින්දර තිබෙන තැන වගේ. ඔතනින් තමයි පත්තුකර ගන්නේ. ඔතනින් අනාපාන සතිය බලාගෙන ඉඳලා එතැනින්ම චිත්ත ඒකාග්‍රතාවය හොඳට සියුම් වෙච්ච මනෝද්වාරික අරමුණක් හිත අතුලට පත්තුකරගෙන, භාවනා නිමිත්ත හැටියට ගන්නවා. ඊට පස්සේ ඒක මනෝද්වාරික භාවයට පරිවර්තනය වෙනවා. ඇතුලට ගිහිල්ලා සියුම් වෙනවා. එහෙම තමයි යන්නේ. මනෝද්වාරික වශයෙන් තමයි ධ්‍යාන සිත් පහළ වෙන්නේ මෙතැනදී, කායද්වාරික වශයෙන් නොවෙයි. ඒ අවස්ථාවේදීත් පළවෙනි දෙවෙනි තුන්වෙනි ධ්‍යාන වලත් පුංචියට තිබෙනවා චලන ස්වභාවයක්. චලන ස්වභාවයක් කියන්නේ අනාපාන සතියක් ඒකෙ වැඩ කරනවා. හැබයි ඒක නාසය ගාව ඉදීම තුලින් මතුකරගත්ත හුරු කරගත්ත චලනයක් මිසක කෙලින්ම හිතට ආපු එකක් නොවෙයි. ඒක භාවනා නිමිත්තක් හැටියට හිතට ගිය එකක්. එහෙම ගියැන් පස්සේ තමයි ධ්‍යාන හසුරුවන්න පුළුවන්. ධ්‍යාන කියන දේවල් කායික නොවෙයි. ඒවා

මානසිකයි. ඔය එක ක්‍රමයක්. ඕක තමයි සූත්‍ර දෙශනාවල් වල තිබෙන ප්‍රායෝගිකව ධ්‍යාන ක්‍රමය.

අනිත් එක තමයි මහත්තයා මම කිව්වේ කල් දානවා කියලා. ඒක තනිකර බණ topic එකක්. මට ඕක මේ මිනුස්සුන්ට කියලා දෙන්න ඕනෑ කමම තිබෙනවා. මටත් හරි පිපාසයක් තිබෙනවා මේක කියලා දෙන්න ඕන කියලා.

ධ්‍යාන තිබෙනවා ප්‍රධාන වශයෙන් දෙකක්. මම සාමාන්‍යයෙන් කියන හැටියට ධ්‍යාන තුනක් කියලා ගමු. එක ධ්‍යානයක් තිබෙනවා **ආරම්මණ උපනිජ්ඣායන ධ්‍යාන**. තව එකක් තිබෙනවා **ලක්ඛණ උපනිජ්ඣායන ධ්‍යානය**. අනිත් එක තමයි **පච්චනීක ධම්ම ඣායන ධ්‍යානය** කියලා තිබෙනවා.

ආරම්මණ උපනිජ්ඣායන ධ්‍යානය කියලා කියන එක තමයි අපි මොකක් හරි අරමුණක් ඒ කියන්නේ බුදුගුණ හරි අනාපානසතිය හරි අරගෙන අනිත් ඒවා ඔක්කොම අමතක කරලා ඒවාගෙන් හිත ගලවගෙන ගිහිල්ලා අපි ගත්ත කසිණයක් හරි මොකක් හරි ඒ ගත්ත අරමුණ ළඟටම හිත ගෙනියවල ගෙනියවලා ඒ අරමුණේම පිරිමැදලා ඒකත් එක්කම ඉන්න එකට කියනවා **ආරම්මණ උපනිජ්ඣායන ධ්‍යානය** කියලා. අනාපානසතිය, බුදුගුණ, කායානු පස්සනා, මරණ සතිය, කසිණ භාවනා, මෛත්‍රීය යන ඔක්කොම ආරම්මණ උපනිජ්ඣායන ධ්‍යාන.

ලක්ඛණ උපනිජ්ඣායන ධ්‍යානය කියලා එකක් තිබෙනවා. දැන් අපිට සංස්කාර ධර්මයන්ගේ අනිත්‍ය බලන්න කියලා කියනවා. දුක බලන්න කියනවා. අනාත්මය බලන්න කියනවා. ඒ අනිත්‍යය දුක්ඛ අනාත්ම කියන ධර්මතාවයන් බල බලා, බල බලා ඉන්නකොට ඒ විදියට හිත එක තැන් වෙනවා. මෙතැනදී අමුතුවෙන් ගිහිල්ලා ගත්තු අරමුණක් නෑ. තිබෙන තිබෙන අරමුණේම ලක්ෂණ ටික බලනවා. වේදනාව මතු උනොත් වේදනාවේ තිබෙන ලක්ෂණය මේකයි කියලා බලනවා. සංඥාවේ ලක්ෂණය මේකයි සංස්කාරයේ ලක්ෂණය මේකයි කියලා ඒ විදියට ඒවායේ ලක්ෂණ

බලනවා. ඒකට කියනවා **ලක්ඛණ උපනිජ්ඣායන ධ්‍යාන** කියලා. ඒක විපස්සනා පැත්තට යනවා.

**පච්චනීක ධම්ම ඣායන ධ්‍යානය -** පච්චනීක ධම්ම කියලා කියන්නේ හිතක් එක තැන් කරගන්න බැරි වෙන විදියට අපිට තිබෙනවා කාමච්ඡන්දය ව්‍යාපාදය ථිනමිද්ධය උද්ධච්ච කුකුච්චය විචිකිච්ඡාව කියන ඔය ප්‍රති විරුද්ධ ධර්ම. ඒ ප්‍රතිවිරුද්ධ ධර්ම නසන මානසික ශක්තියක් තිබෙනවා. ඒකට කියනවා ප්‍රතිපක්‍ෂ නීවරණ ඣාපනය කරන ධ්‍යාන කියලා. ඔන්න ප්‍රධාන ධ්‍යාන ධර්මතා තුන.

තවත් එකක් තිබෙනවා. ඒකට කියනවා ධ්‍යාන අංග කියලා. ධ්‍යාන අංග තිබෙනවා හතක්. ඒ තමයි විතක්ක - විචාර - පීති - සුඛ - ඒකග්ගතා - සෝමනස්ස දෝමනස්ස - උපේක්ඛාව. දැන් මේ හත යම් කිසි කෙනෙකුගේ හිතේ පිළිවෙලකට වැඩ කරනවා නම් එතකොටත් කියනවා ධ්‍යාන ධර්ම තිබෙන හින්දා ධ්‍යාන තිබෙනවා කියලා. දැන් මේ කියන්නා වූ ධ්‍යාන ධර්ම 7 න් එකක් හරි තිබෙනවා නම් කියන්න පුළුවන් ධ්‍යාන ධර්ම තිබෙනවා කියලා. කාට හරි තරහ යනවා. නැතනම් මොකක් හරි අකුසලයක් විතර්ක කර කර ඉන්නවා. ඒ අකුසලයක් විතර්ක කර කර ඉන්නකොටත් කෙනෙකුට කියන්න පුළුවන් විතර්කය වගේ ධ්‍යාන අංග තිබෙන නිසා දැන් ධ්‍යාන තිබෙනවා කියලා, තර්කානුකූලව. හේතුව ධ්‍යාන අංග තිබෙන නිසා. විතක්කය තිබෙනවා විචාරය තිබෙනවා දෝමනස්සය තිබෙනවා. එහෙම නැත්නම් කවුරුහරි කාම අරමුණක් ගැන හිත හිත ඉන්නවා. එතකොටත් විතක්කය තිබෙනවා විචාරය තිබෙනවා පීතියත් ඕක අස්සේ තිබෙනවා. එතකොටත් කියන්න පුළුවන්. හැබැයි ඒක ඔය කියන කථාවේ හැටියට ධ්‍යාන උනාට ඒවා කුසල ධ්‍යාන නොවෙයි. ඕවා අකුසල ධ්‍යාන. අකුසල සමාපත්ති. සූත්‍ර වලනම් ඕවට කියන්නේ මෛථුනධම්මසමාපත්ති කියලා.

අපි බලනවනේ දැන් වචනය දාල. දැන් අපි ඉංග්‍රීසියෙන් history කියලා කියනවා. දැන් අපි ඕක දෙකට කඩලා (his + tree = ඔහුගේ + ගහ) කියලා කියන්න පුළුවන්.

ඒවාගේ වචනයට දාල ශබ්දයට දාල ගත්තහම ධ්‍යාන අංග තිබෙන නිසා ඕනෑම කෙනෙකුට කියන්න පුළුවන් ධ්‍යාන තිබෙනවා කියලා. හැබැයි ප්‍රශ්නය තිබෙන්නේ ඒවා නිවන් දකින්න පුළුවන් බ්‍රහ්මලෝකේ යන්න පුළුවන් හයිය හත්තිය තිබෙන කුසල ධ්‍යානද කියන එකයි.

ඒක නිසා මහත්තයා ධ්‍යාන කථා කරන්න ඕන වෙන්නේ එකක් **ආරම්මණ උපනිජ්ඣායන** වශයෙන් **(කුසල)**. අනිත් එක **ලක්ඛණ උපනිජ්ඣායන** වශයෙන් **(කුසල). පච්චනීක ධම්ම ඣාපනය** වශයෙන් **(කුසල).** ඊළඟට අංග වශයෙන් **කුසල ආරම්මණයකට එක්කාසු වෙච්ච අංග**. ඒ තමයි අපි නිතර කියන විතක්ක විචාර පීති සුඛ ඒකාග්ගතා. මේ ධ්‍යාන කොට්ඨාශ 4 වෙන වෙනම වෙන වෙනම කවලම් කරගන්නේ නැතුව පටලවාගන්නේ නැතුව පිරිසිඳුව යම් කිසි සත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ පැවිද්දෙක් හෝ ගිහිකෙනෙක් මේ කියන්නේ මෙතැනයි කියලා හරියට තේරුම් ගන්න පුළුවන් කම තිබුණා නම් එයා ඒකාන්තයෙන්ම හොඳ දැනුමක් තිබෙන, ධ්‍යාන ඇතත් නැතත් ධ්‍යාන හොඳට හඳුනාගත්ත, මේ අහවල් එකයි කියලා තේරුම් ගත්ත කෙනක් කියලා මට පෞද්ගලිකව මේ ධර්මයට අනුව කියන්න පුළුවන්.

අපි හිතමු මෙහෙම. අපි පලා කොළ ජාතියක් කනවා කියල හිතමු. ඔය පලා කොළ මලවලා කන්නත් පුළුවන්. කැඳට හදලා ගන්නත් පුළුවන්. එතකොටත් ඒකෙ තිබෙන ගුණය ගත්තා වෙනවා. බැදලා කන්නත් පුළුවන්. දැන් තිබෙනවා ක්‍රමයක් තේ බොන්නත් පුළුවන්. දැන් තිබෙනවා මේ රටවල මොනවාද දන්නේ නෑ කොස් කොළද දන්නෙත් නෑ, කෑලි වලට කපලා කපලා වේලවලා bush tea කියලා තිබෙනවා. එක එක නම් වලින් තිබෙනවා. වචන පාවිච්චිය වෙනස්. එක වෙලාවකට තේ බොනවා කියනවා. එක වේලාවකට මැල්ලුම් කනවා කියනවා. එක වෙලාවකට කැඳ බොනවා කියනවා. එක වෙලාවකට උයලා කනවා කියනවා. ඔය වගේ තමයි මේ ධ්‍යාන අංග වශයෙන් බැලුවයින් පස්සේ ඒ අංග හැම තැනම තිබෙනවා. හැබැයි අපිට තෝරාගන්න ඕන වෙන්නේ මේක නිවන් දකින්න හේතුවෙන ඇත්තටම චිත්ත ඒකාග්‍රතාවයක් හදාගෙන චිත්ත සමාධියක් විඳින්න පුළුවන් ධ්‍යානයක්ද කියන එක පරෙස්සමෙන්

තෝරා ගන්න එකයි. මේක ලොකුම ලොකු topic එකක්. මේක සැරියුත් ස්වාමීන්වහන්සේ ගොඩාක් විස්තර කරලා තිබෙනවා. ඒක ලොකුවට ඇදිලා යන නිසා මේ ඩිංග උත්තරයක් හැටියට විතරක් කියලා දෙනවා. තෙරුවන් සරණයි!

Bruno මහත්මයා - ගොඩක් පිං ස්වාමීන්වහන්ස. ඔය කියපු ටිකනම් හරි වටිනවා. මේක අහන්න හේතුවත් උනේ දැන් තිබෙන ධ්‍යාන සම්බන්ධව තිබෙන කථා නිසා. ප්‍රීතිය සතුට කියන ඒවා කාය ප්‍රසාදය එක්ක සම්බන්ධ කරලා අමුතුම බණ ඇහෙන කාලයක් නිසා ගොඩක්ම ප්‍රයෝජනවත් වෙනවා. සමාව ඉල්ලනවා අනිත් අයගෙන් කාලය දික්වීම පිළිබඳව. තෙරුවන් සරණයි!

ජයන්ත මහත්මයා - මම හිතනවා අද සාකච්ඡාව නිමා කරන්න කාලය එළඹිලා තිබෙනවා කියලා. ස්වාමීන්වහන්ස සවනට සිසිලස වෙනුවෙන් නැවත වරක් ඔබ වහන්සේට ඉතාම කෘතවේදීව පුණ්‍යානුමෝදනා කර සිටිනවා ඔබ වහන්සේගේ කාලය ශ්‍රමය අපි වෙනුවෙන් මේ ආකාරයෙන් කැප කිරීම සම්බන්ධයෙන්. ඔබවහන්සේට ඉතාමත් ගෞරවයෙන් නැවත වරක් යොමුවෙනවා අද දවසේ සාකච්ඡාව නිමා කරන ලෙසට. තෙරුවන් සරණයි!

<u>ස්වාමීන්වහන්සේ</u> - හොඳයි පින්වත් සැමදෙනාම සතුටු වෙමු. අපේ පින්වත් ලලිත් දළුවත්ත මහත්මයා ආරම්භ කරලා දීර්ඝ කාලයක් කරගෙන ආවා වූ මේ පින්වත් වැඩ සටහනේ කොටස් කාරයෝ සාමාජිකයෝ බවට පත්වෙලා මේ පින්වතුන් ගොඩක් කුසල් රැස් කරගන්නවා. ධර්මඥානය ලබා ගන්නවා කුසල් රැස් කරගන්නවා. සාකච්ඡා කිරීම වශයෙන් බණ ඇසීම වශයෙන්. අදත් ඉතින් ගැඹුරු කාරණා කීපයක් තමයි අපි හිතුවේ මෙනෙහි කළේ දැන ගත්තේ. ඒ නිසා අපේ පින්වත් දළුවත්ත මහත්මයාටත් ඒ පවුලේ සැමදෙනාටමත් ප්‍රශ්න ඇසූ ඒ Bruno මහත්මයා ජයන්ත මහත්මයා සහ අසාගෙන සිටියා වූ පින්වත් මහත්මයලා මහත්මීන් සැමදෙනාටමත් ශාන්තියක් සැනසිල්ලක් යහපතක්ම වේවා!

මම මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරන්නේ කිසිම අවස්ථාවක කල්‍යාණමිත්‍ර නොවෙන්නා වූ අසත් පුරුෂයන් කිසිම කාලයක දේශීය වශයෙන් විදේශීය වශයෙන් මනුෂ්‍යලෝක වශයෙන් දිව්‍යලෝක වශයෙන් බ්‍රහ්මලෝක වශයෙන් හෝ හමු නොවේවා! මිත්‍යා දෘෂ්ඨික දෙවියෙක්වත් හමු නොවේවා! මිත්‍යා දෘෂ්ඨික දෙවි කෙනෙකුගේ දිව්‍ය ආලෝකයක්වත් ඇඟට නොවදීවා! කියලා. මිත්‍යා දෘෂ්ඨික බ්‍රහ්මයෙකුගේ ආලෝකයක්වත් ගෙවල් පැත්තකටවත් හසු නොවේවා! නොවැටේවා! සත්පුරුෂයෝ කියන උත්තමයන්ගේ පොඩි කලාමැදිරි එළියක් තරම් හෝ ආලෝකයක් ඇත්නම් ඒකත් යහපතක් වෙනවා. ඒක නිසා කල්‍යාණ මිත්‍රයෝම හමුවේවා! මුණ ගැහේවා! කල්‍යාණ මිත්‍රයන්ගේ දැකීම ඒකාන්තයෙන්ම ලැබේවා! කල්‍යාණ මිත්‍රයන් කථා නොකර ළඟින් හිටියත් ඒත් ඇති. ඒ අය හානියක් සිද්ධ කරන්නේ නෑ තමන්ට. කල්‍යාණ මිත්‍රයෝ කථා කලත් කෙටියෙන් හෝ දෙයක් කිව්වොත් ඒ ටිකත් යහපතක් හැටියට සලකනවා. කථා නොකර හිටියත් කල්‍යාණමිත්‍රයාගේ ඒකත් ගුණයක්. ඒක නිසා කල්‍යාණ මිත්‍ර ආශ්‍රය කල්‍යාණ මිත්‍රයන්ගේ ධර්මයම ලැබේවා! කිසීම තැනකදී ඔය බණ නමින් ඇහෙන්නා වූ බොරු කථා වලට ඒවාගේම මිත්‍යා වචන වලට මිත්‍යා දේශනා වල් වලට හසු නොවී ඇත්ත ඇති හැටියට තේරුම් ගන්න ලැබේවා! බොරුව බොරුව හැටියට තේරුම් ගන්න ලැබේවා! ඒවාගේම ඇත්තේ හැඩ රුව අරගෙන බොරුව යන බවත් තේරුම් ගන්න ලැබේවා! ඒක ඇත්තක් නැති බොරුවක් බවත් තේරුම් ගන්න ලැබේවා! ධර්මය ධර්මය හැටියට වැටහේවා! අධර්මය අධර්මය හැටියට වැටහේවා! කිසිම තැනකදී අධර්මයට ධර්මය කියලා මුලා නොවේවා! ඒවාගේම අවිනයට විනය කියලා මුලා නොවේවා! සැම දෙනාටම තමන්ගේ සිත ඍජුව ප්‍රකාශ කරන්නට ශක්තිය ලැබේවා! ධෛර්ය ලැබේවා! කිසිම කෙනෙකුගේ වචනයකට අධර්මයකට යට නොවේවා! ඍජු සිතක් පහළ වේවා! මාරයාටවත් භය නැති හිතක් පහළ වේවා! ඒකට මේ ධර්මය පිහිට වේවා! සැමදෙනාටම ඍජු සිතක් හදාගෙන ඉතා මනාකොට ඍජු සිතක් හදාගෙන සුපටිපන්න ගුණයෙන් යුක්ත වෙච්ච මහා සංඝ රත්නයේ ගුණ දරාගෙන ඒ ගමන් මාර්ගයේ ගමන්කොට ඍජු ප්‍රතිපත්තියේ ගමන්කොට ඍජුව නිර්භයව ශාන්තව සැනසිල්ලේ නිර්වාණ ධාතුව ස්පර්ශකොට නිවනින්ම සැනසෙන්න ලැබේවා කියලා බොහෝම මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා. සැමදෙනාටම තෙරුවන් සරණයි!

සාධු! සාධු! සාධු!

සීලවන්තං ගුණවන්තං – පුඤ්ඤංඛෙත්තං අනුත්තරං
දුල්ලභේන මයා ලද්දං – පස්සිතුං වන්දිතුං වරං
සාරිපුත්තාදි ථේරානං – ආගතං පටිපාටියා
සද්ධා ශීලං දයා වාසං – බුද්ධ පුත්තං නමාමහං

සිලවත් වූ ගුණවත් වූ – උත්තම පුණ්‍ය ක්ෂේත්‍රයක් බඳු වූ
සංඝයා වහන්සේලාව ප්‍රසාදයෙන් යුතුව වැඳීමට ලැබීම මා ලැබූ දුර්ලභ භාග්‍යයකි.
සැරියුත් මහරහතන් වහන්සේ ආදී – උත්තමයන්ගෙන් පැවත එන්නාවූ
ශ්‍රද්ධාවට ශීලයට කරුණාවට වාසස්ථාන බඳු – බුද්ධ පුත්‍රයන් වහන්සේට මම නමස්කාර කරමි.



ඉහත සඳහන් ධර්ම දේශනාව
අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.